# ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය
# 2024

## කොළඹ දිස්ත්‍රික්කය



කම්කරු දෙපාර්තමේන්තුව
කම්කරු අමාත්‍යාංශය

# ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය

# 2024

## කොළඹ දිස්ත්‍රික්කය

**කම්කරු දෙපාර්තමේන්තුව**

**කම්කරු අමාත්‍යාංශය**

ISBN 978-624-6096-13-7

ප්‍රකාශනය:

2024 දෙසැම්බර්

සංඛ්‍යාලේඛන අංශය

කම්කරු දෙපාර්තමේන්තුව

"මෙහෙවර පියස"

නාරාහේන්පිට

කොළඹ 05

මුද්‍රණය

New Print Care - කැලණිය

# පෙරවදන

ළමා ශ්‍රමය යනු දරුවෙකුගේ අධ්‍යාපනය, සෞඛ්‍ය හා සාමාජයීය යන සෑම අංශයක ම පරිහානිය ට හේතු වන්නා වූ කරුණකි. එ මගින් දරුවාගේ ළමා කාලය මෙන් ම අනාගතය ද පරිහානියට පත් වේ. එපමණක් නොව එය සමස්ත සමාජය ට ම අහිතකර ලෙස බලපායි.

එ බැවින් ළමා ශ්‍රමය තුරන් කිරීම මෙන් ම දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇතුළු සංවිධාන රැසක් පෙරමුණ ගෙන ක්‍රියාකරමින් සිටී.

ශ්‍රී ලංකාව ද වසර ගණනාවක සිට විවිධ  වැඩසටහන් ක්‍රියාත්මක කරමින්, මෙම අභියෝගය සඳහා සාර්ථක ව මුහුණ දෙමින් සිටී. මේ සඳහා කම්කරු දෙපාර්තමේන්තුව ප්‍රමුඛ සියළු පාර්ශවයන් විසින් ඉටු කළ මෙහෙය අතිමහත් වේ.

ශ්‍රී ලංකාව ළමා ශ්‍රමිකයන්ගෙන් තොර රටක් බවට පත් කිරීමේ අභිලාෂය මුදුන් පමුණුවා ගැනීමේ උපාය මාර්ගයක් ලෙස ළමා ශ්‍රමයෙන් තොර කලාප ඇති කිරීම සඳහා කටයුතු කරමින් සිටී. මෙහි තවත් පියවරක් ලෙස 2024 වසර තුළ කොළඹ දිස්ත්‍රික්කය පාදක කරගනිමින් ළමා ශ්‍රමය තුරන් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එහි ප්‍රගතිය තක්සේරු කරනු පිණිස 2024 වසර තුළ දී කොළඹ දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් “ළමා ශ්‍රමය පිළිබඳ මෙම අධ්‍යයනය ” සිදු කරන ලදී.

කම්කරු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය සහ කාන්තා හා ළමා කටයුතු අංශය එක් ව සිදු කරන ලද මෙම අධ්‍යයනයෙ හි ප්‍රතිඵල ඇසුරින් “ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය - 2024 (කොළඹ දිස්ත්‍රික්කය)” වාර්තාව සකස් කර ඇත.

ළමා ශ්‍රමිකයන් පිළිබඳ දත්ත හිඟ අවස්ථාවක ඉතා වැදගත් තොරතුරු රැසක් මෙ මගින් අනාවරණය කර ගැනීම ට හැකි වී ඇත. එම දත්ත අනාගත සැලසුම් සකස්  කිරීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇතැයි විශ්වාස කරමි.



එච්.කේ.කේ.ඒ. ජයසුන්දර
කම්කරු කොමසාරිස් ජනරාල්

# ස්තූතිය

"ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය - 2024 (කොළඹ දිස්ත්‍රික්කය)" සංඛ්‍යාලේඛන අංශය විසින් ප්‍රථම වරට ළමා ශ්‍රමය පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද අධ්‍යයනයකි. කම්කරු දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත එම දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

මෙම අධ්‍යයනයේ සමස්ත සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම කම්කරු කොමසාරිස් ජනරාල්, එච්.කේ.කේ.ඒ. ජයසුන්දර මහතාගේ මගපෙන්වීම යටතේ සංඛ්‍යාලේඛන අංශයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී.

නියැදි රාමුව ලෙස යොදාගන්නා ලද්දේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කර ඇති, 2023 වසරේ ඡන්දහිමි නාම ලේඛනය යි. අතිරේක මැතිවරණ කොමසාරිස්, එච්. ආර්. පී. පීරිස් **මහතා**ගේ මගපෙන්වීම යටතේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (කොළඹ නාගරික)**,** එම්.එම්.එස්.කේ. බණ්ඩාර මාපා මහතාගේ හා නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (කොළඹ දිස්ත්‍රික්), ආර්.එස්. වෙදගේ මහතාගේ මැදිහත් වීමෙන් එම තොරතුරු ලබා ගන්නා ලදී.

දත්ත රැස් කිරීම සඳහා වන උපකාරක යෙදවුම සකස් කිරීම, එහි ක්‍රියාකාරීත්වය අධීක්ෂණය මගින් මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ, ඊ.එම්. දිසාලා ඒකනායක මහතාගේ මගපෙන්වීම යටතේ තොරතුරු තාක්ෂණ නිලධාරි, එස්. ඩබ්. එන්. ඩී. අත්තනායක මහතා විසින් ලබා දෙන ලද සහයෝගය ඉතා අගය කරමි.

අධ්‍යයනය සඳහා මූල්‍ය ප්‍රතිපාදන කාන්තා හා ළමා කටයුතු අංශයට වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදන යටතේ සුනිති මෙහෙවර ව්‍යාපෘතිය මගින් ලබා දෙන ලදි. අධ්‍යයනයේ සමස්ත අධීක්ෂණය මාගේ මග පෙන්වීම යටතේ සංඛ්‍යාලේඛනඥ, කේ.ඒ.පී. දීපානි මිය හා සංඛ්‍යාලේඛනඥ, ඩබ්.ඒ.එස්. මල්කාන්ති මිය විසින් සිදු කරන ලදී.

දත්ත රැස් කිරීම, සංස්කරණය කිරීම, කේත කිරීම, දත්ත පරිගණක ගත කිරීම සහ අනෙකුත් සියළු කටයුතු සංඛ්‍යාලේඛන නිලධාරීන් වන එච්.ඊ. වික්‍රමසූරිය මිය, ආර්.එම්.එස්. ප්‍රියදර්ශන මයා, එල්.ඒ.ඒ.ඩබ්ලිව්. ගුණවර්ධන මිය, හා ඩබ්ලිව්.පී.ජී.එන්.පී. ගුරුගේ මිය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් වන එච්.ඒ. ඉන්දික ප්‍රභාත් මයා හා ඩී.එන්. සෝමසිරි මයා, කළමනාකරන සේවා නිලධාරීන් වන එස්.පී. මංගලිකා මිය හා එල්.ඩී.සී.ජේ. කුමාර මයා සහ කාර්යාල කාර්ය සහයක, ඒ.ටී. වසන්ත මයා යන නිලධාරීන් විසින් සිදු කරන ලදී.

පරිගණක දත්ත සැකසීම සහ අවසන් වගු සකස් කිරීම සංඛ්‍යාලේඛන නිලධාරි, ආර්.එම්.එස්. ප්‍රියදර්ශන මහතා විසින් සිදු කරන ලදී. මෙම වාර්තාව සඳහා ආවරණ පිටුව නිර්මාණය කිරීම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරි, එච්.ඒ. ඉන්දික ප්‍රභාත් මහතා විසින් සිදු කරන ලදී.

අධ්‍යයනය සඳහා අවශ්‍ය ප්‍රශ්නාවලිය සකස් කිරීම සහ වාර්තාව සකස් කිරීම සංඛ්‍යාලේඛනඥ, ඩබ්ලිව්.ඒ.එස්. මල්කාන්ති මහත්මිය විසින් සිදු කරන ලදී.

තවද, අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල්, එස්.ඒ.ඩබ්. අල්ගම මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන කමිටුව විසින් මෙම වාර්තාව ප්‍රකාශයට පත් කිරීම සඳහා අප වෙත ලබා දුන් සහයෝගය කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.



වී.පී. ලලිත්
නියෝජ්‍ය අධ්‍යක්ෂ
සංඛ්‍යාලේඛන අංශය

## විධායක සාරාංශය

කොළඹ දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ම ආවරණය වන සේ ලියාපදිංචි පවුල් සංඛ්‍යාව පදනම් කර ගනිමින් සසම්භාවී ව තෝරා ගන්නා ලද නිවාස ඒකක 1000 ක නියැදියක් අධ්‍යයනය කිරීමෙන් ළමා ශ්‍රමය පිළිබඳ මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මේ සඳහා ගෘහ ඒකක සමීක්ෂණ ක්‍රමය මෙන් ම කඩිනම් තක්සේරු අධ්‍යයන ක්‍රමය යොදා ගත් අතර අධ්‍යයනයේ ප්‍රධාන ම අරමුණ වූයේ ළමා ශ්‍රමය පිළිබඳ දත්ත රැස් කිරීම යි. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ සමස්ත ළමා ජනගහනයෙන් 0.3% ක් ළමා ශ්‍රමිකයන් බව අනාවරණය විය. මෙයින් 0.1% ක් අනතුරුදායක රැකියාවල නිරත දරුවන් විය.

මෙම අධ්‍යයනයෙහි ළමා ජනගහනය යනු වයස අවුරුදු 5 සිට 17 දක්වා වයස් කාණ්ඩයට අයත් ජනගහනය වන අතර කොළඹ දිස්ත්‍රික්කය තුළින් වාර්තා වූ ළමා ජනගහනය 16.7% කි. එයින් 51% ක් ගැහැණු ජනගහනය වන අතර 49% ක් පිරිමි වේ. ළමා ජනගහනයෙන් වයස අවුරුදු 5 සිට 11 දක්වා කාණ්ඩයට 47.2% ක ප්‍රතිශතයක් අයත් වූ අතර වයස අවුරුදු 12 සිට 15 දක්වා කාණ්ඩයට 35% ක ප්‍රතිශතයක් අයත් විය. තරුණ ජනගහනය අයත් වයස අවුරුදු 16 සිට 17 දක්වා කාණ්ඩයට අයත් වූයේ 17.8% ක ප්‍රතිශතයකි.

මෙම අධ්‍යයන ප්‍රතිඵල අනුව ළමා ජනගහනයට අයත් දරුවන්ගෙන් 96.1% ක් පාසල් යන දරුවන් වේ. පාසල් නො යන ළමුන්ගේ ප්‍රතිශතය 3.9% කි. පාසල් නො යන දරුවන්ගෙන් 58.3% ක් අවුරුදු 5-11 දක්වා වයස් කාණ්ඩයට අයත් වේ. මෙය සමස්ත ළමා ජනගහනයෙන් 2.3% ක ප්‍රතිශතයකි. වයස අවුරුදු 12 සිට 17 වයස් කාණ්ඩයට අයත් වන ප්‍රතිශතය 41.7% කි. මෙය සමස්ත ළමා ජනගහනයෙන් 1.6% ක ප්‍රතිශතයකි. අධ්‍යයන ප්‍රතිඵල අනුව පාසල් නො යන දරුවන්ගෙන් 2.3% ක ප්‍රතිශතයක් වයස සම්පූර්ණ නොවීම නිසා පාසල් නො යන දරුවන් වේ. මෙම දරුවන් අතරින් 0.3% ක් ආර්ථික කටයුතුවල නිරත වන අතර 1.3% ක් කිසිදු කාර්යයකට දායක නොවන දරුවන් වේ.

කොළඹ දිස්ත්‍රික්කය තුළ ළමා ජනගහනයෙන් 2.3% ක් වැඩ කරන ළමා ජනගහනයට අයත් වන බව මෙහිදී අනාවරණය විය. මෙයින් 36% ක් ගැහැණු දරුවන් වන අතර 64% ක් පිරිමි දරුවන් වේ. වැඩ කරන දරුවන් අතරින් 14.3% ක ප්‍රතිශතයක් වයස අවුරුදු 5 සිට 11 දක්වා වයස් කාණ්ඩයට අයත් වන අතර මෙය සමස්ත ළමා ජනගහනයෙන් 0.3% ක ප්‍රතිශතයකි. එසේ ම වැඩ කරන දරුවන්ගෙන් 35.7% ක් වයස අවුරුදු 12-15 දක්වා වයස් කාණ්ඩයට අයත් වේ. වැඩ කරන දරුවන්ගෙන් අධික්ම අයත් වන්නේ තරුණ දරුවන් අයත් වයස අවුරුදු 16 සිට 17 දක්වා වයස් කාණ්ඩයට ය. එය සමස්ත ළමා ජනගහනයෙන් 1.1% ක ප්‍රතිශතයකි.

දරුවන් නිරත වන රැකියාවේ තත්ත්වය අනුව සලකා බැලීමේ දී, 21.4% ක් සේවකයන් ලෙස සේවය කරන අතර 7.1% ක් තමාගේ ම ආර්ථික කටයුතු වල නිරත වන දරුවන් වේ. වැඩිම ප්‍රතිශතයක් එනම්, 71.4% ක් පවුලේ ආර්ථික කටයුතු සඳහා දායක වන දරුවන් වේ. දරුවන් සතියක් තුළ වැඩ කරන කාලය ළමා ශ්‍රමය මැනීමේ වැදගත් නිර්ණායකයකි. අධ්‍යයන ප්‍රතිඵල අනුව දරුවන්ගෙන් වැඩිම ප්‍රතිශතයක් සතියකට පැය 5 සිට 24 දක්වා කාලය තුළ වැඩ කරන බව අනාවරණය විය. එය 64.3% ක ප්‍රතිශතයකි.

# පටුන


පෙරවදන ............... .................. .................. .................. .................. i

ස්තූතිය .................. .................. .................. .................. .................. iii

විධායක සාරාංශය ....... .................. .................. .................. .................. v

පටුන ........................ ....................... ..................... ......................... ......................... vii

1 හැඳින්වීම

පසුබිම ............. ..................... ................. ........................ ............... 1

අරමුණු ............. ..................... ................. ........................ ............... 2

සංකල්ප හා නිර්වචන .................... ................. ........................ ............. 2

විෂය පථය හා ආවරණය ............. ................. ........................ ............. 3

අධ්‍යයන ක්‍රමවේදය ................... ................. ........................ ............. 3

2 ළමා ජනගහනය

ස්ත්‍රී පුරුෂ භාවය අනුව ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) .......... .......... 7

වයස් කාණ්ඩ අනුව ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) .......... ............. 8

පාසල් යන හා නො යන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) ...... .......... 9

3 වැඩ කරන ළමා ජනගහනය

ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩ කරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) ...... 14

වයස් කාණ්ඩ අනුව වැඩ කරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) ........... 14

රැකියා තත්වය අනුව වැඩ කරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) .......... 15

වැඩ කරන පැය ගණන අනුව වැඩ කරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) . 16

4 ළමා ශ්‍රමිකයන් හා අනතුරුදායක රැකියාවල නියුතු ළමා ශ්‍රමිකයන්

ළමා ශ්‍රමිකයන් හා අනතුරුදායක රැකියා 17

ළමා ශ්‍රමික අවධානම සහිත බවට හඳුනාගත් ප්‍රදේශ හා ඊට හේතු 19

5 නිගමන හා යෝජනා

යෝජනා ........................ ................. ........ 21

නිගමන ............. ..................... ................. ........................ ................ 22

# වගු ලැයිස්තුව


| | | |
|---|---|---|
| වගුව 1.1: | අධ්‍යයන ඒකක සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව .................... | 5 |
| වගුව 2.1: | ළමා ජනගහනය වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව (කොළඹ දිස්ත්‍රික්කය) ............. ....................... ...................... .................... ...... | 8 |
| වගුව 2.2: | ළමා ජනගහනයෙන් පාසල් යන හා නො යන දරුවන් (කොළඹ දිස්ත්‍රික්කය) | 10 |
| වගුව 2.3: | පාසල් යන හා නොයන දරුවන්ගේ ව්‍යාප්තිය වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව (කොළඹ දිස්ත්‍රික්කය) ...................... ...................... .............. | 11 |
| වගුව 3.1: | වැඩ කරන ළමා ජනගහනය ළමා ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස .............. | 14 |
| වගුව 3.2: | වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩ කරන ළමා ජනගහනය සමස්ත ළමා ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස (කොළඹ දිස්ත්‍රික්කය) ................. ....... | 15 |
| වගුව 3.3: | රැකියා තත්ත්වය අනුව වැඩ කරන ළමා ජනගහනය මුළු ළමා ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස ................... .................. .................... ..................... | 15 |
| වගුව 4.1: | ළමා ශ්‍රමිකයන් හා අනතුරුදායක රැකියාවල නිරත ළමා ජනගහනය, ළමා ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස .......................... ..................... ........... | 18 |

## ප්‍රස්තාර ලැයිස්තුව


| | | |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1: | මුළු ජනගහනයට අනුව ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) ........... | 7 |
| ප්‍රස්තාරය 2.2: | ස්ත්‍රී පුරුෂ භාවය අනුව ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) .............. | 8 |
| ප්‍රස්තාරය 2.3: | වයස් කාණ්ඩ අනුව ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) .................. | 8 |
| ප්‍රස්තාරය 2.4: | වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) ................ .................... ...................... .............. ............ | 9 |
| ප්‍රස්තාරය 2.5: | පාසල් අධ්‍යාපනය ලබන හා නො ලබන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) ................ ....................... .................... ........................ | 10 |
| ප්‍රස්තාරය 2.6: | පාසල් අධ්‍යාපනය ලබන හා නො ලබන ළමා ජනගහනය ස්ත්‍රී පුරුෂ භාවය අනුව (කොළඹ දිස්ත්‍රික්කය) ...................... .......................... ............... | 11 |
| ප්‍රස්තාරය 2.7: | පාසල් අධ්‍යාපනය නො ලබන ළමා ජනගහනය ස්ත්‍රී පුරුෂ භාවය අනුව | 11 |
| ප්‍රස්තාරය 3.1: | ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩ කරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) | 14 |
| ප්‍රස්තාරය 3.2: | වයස් කාණ්ඩ අනුව වැඩ කරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) | 14 |
| ප්‍රස්තාරය 3.3: | රැකියා තත්ත්වය අනුව වැඩ කරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) | 15 |
| ප්‍රස්තාරය 3.4: | සතියක් තුළ වැඩ කරන පැය ගනණ අනුව වැඩ කරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය) ................ ........................ ...................... ...... | 16 |
| ප්‍රස්තාරය 4.1: | ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය-2008/09, ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය-2016 හා ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය-2024 ට අනුව ළමා ශ්‍රමික ප්‍රතිශතය (කොළඹ දිස්ත්‍රික්කය) ................... ....................... .................... .......... | 18 |
| ප්‍රස්තාරය 5.1: | ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වූ යෝජනා .................. ................. .......... | 21 |

# 1 පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 පසුබිම

වත්මන් සංකීර්ණ සමාජය තුළ විවිධ හේතූන් මත දරුවන් විවිධ ආර්ථික ක්‍රියාකාරකම් වල නිරත වේ. ඔවුන් විසින් සිදු කරන මෙවැනි ක්‍රියාකාරකම් සියල්ල ළමා ශ්‍රමය ලෙස වර්ගීකරණය කල නොහැක. දරුවාගේ සෞඛ්‍යයට සහ පුද්ගල සංවර්ධනයට සෘණාත්මක ලෙස බල නොපාන හෝ ඔවුන්ගේ පාසල් අධ්‍යාපනයට බාධාවක් නොවන, නව යොවුන් වියේ පසුවන දරුවන්ගේ ක්‍රියාකාරකම් සාමාන්‍යයෙන් සලකන්නේ ධනාත්මක කරුණක් ලෙස ය. මෙවැනි ක්‍රියාකාරකම් දරුවන්ගේ සංවර්ධනයට සහ ඔවුන් ගේ පවුල්වල සුබසාදනයට දායකවන අතර දරුවන් ට කුසලතා සහ අත්දැකීම් හිමි කර දෙයි.

**ළමා ශ්‍රමය**

ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව ළමා ශ්‍රමය යනු ළමයින්ගේ ළමා කාලය, ඔවුන්ගේ හැකියාවන් හා අභිමානය අහිමි කරන, කායික සහ හෝ මානසික වර්ධනය ට හානිකර ක්‍රියාවන් ය. මෙ මගින් දරුවන්ගේ ළමා කාලය සහ අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා අහිමි කරයි. එසේම දරුවන් බරපතල සෞඛ්‍ය ගැටලුවල ට, සූරාකෑම ට සහ අපයෝජනයන් ට ලක් විය හැකි ය.

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලට අනුව ළමා ශ්‍රමය බොහෝ විට දරුවෙකුට නිතිපතා පාසලට පැමිණීමේ හැකියාවට බාධා කරන හෝ අතරමගදී පාසල හැර යාමට බලකරන කාර්යයකි. එ තුළ මානසික, ශාරීරික, සමාජයීය හෝ සදාචාරාත්මක වශයෙන් අනතුරුදායක සහ දරුවන්ට හානිකර වැඩ ඇතුළත් වේ.

මේ නිසා බොහෝ රටවල ළමා ශ්‍රමය නීති විරෝධී වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN) සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) වැනි ජාත්‍යන්තර සංවිධාන ළමා ශ්‍රමය තුරන් කිරීමට සහ දරුවන්ට ආරක්ෂාව, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සම්පන්න දිවියක් ගත කිරීමට අවශ්‍ය පරිසරයක් ඇති කිරීම සහතික කිරීම ට කටයුතු කරයි.

**අනතුරුදායක රැකියා**

දරුවෙකුගේ සෞඛ්‍යය ට, ආරක්ෂාව ට සහ හෝ සදාචාරය ට සෘජු තර්ජනයක් වන ක්‍රියාකාරකම් අනතුරුදායක රැකියා වේ. එනම්,

- දරුවන් කායික, මානසික, හෝ ලිංගික හිංසනයට නිරාවරණය වන වැඩ කිරීම
- පොළොව යට, ජලය යට, අනතුරුදායක උසක හෝ සීමිත අවකාශයක වැඩ කිරීම
- භයානක යන්ත්‍රෝපකරණ සහ මෙවලම් සමග වැඩ කිරීම
- සෞඛ්‍ය සම්පන්න නොවන පරිසරයක වැඩ කිරීම
- දිගු වේලාවක් හෝ රාත්‍රී වැඩ කිරීම

ආදී ක්ෂේත්‍රයන් හි වැඩ කිරීම දරුවාට අනතුරුදායක වේ.

දරිද්‍රතාවය, අධ්‍යාපනයට ප්‍රවේශය නොමැතිකම, සංස්කෘතික සම්මතයන්, ආර්ථික කම්පන වැනි හේතු ළමා ශ්‍රම අනුපාතයන් ඉහළ දැමීම ට හේතු වේ.

**නීතිමය රාමුව හා මැදිහත් වීම්**

ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCRC) මගින් ළමුන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය, ආරක්ෂාව හා ආරක්ෂාකාරී පරිසරයක් තුළ ජීවත් වීමේ අයිතිය වැනි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අවධාරණය කරයි.

ළමා ශ්‍රමය සම්බන්ධ ව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් දෙක කි. එනම්, 1973 අංක 138 දරන සේවා නියුක්තිය සඳහා වූ අවම වයස පිළිබඳ සම්මුතිය හා 1999 අංක 182 දරන ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් පිළිබඳ සම්මුතිය යි. මේවා මූලික සම්මුතීන් ය. ශ්‍රී ලංකා රජය විසින් මෙම සම්මුතීන් පිළිගෙන ඇත.

ශ්‍රී ලංකාව තුළ ද ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් පිළිබඳ උපාය මාර්ගික සැලැස්ම-2016, ළමයින් සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2010-2014), ශ්‍රී ලංකාවේ ශ්‍රමය සූරාකෑම සඳහා ළමයින් නීති විරෝධී ලෙස යෙදවීම ට එරෙහි වීම පිණිස වූ ජාතික ක්‍රියාකාරි සැලැස්ම-2001 ආදී වශයෙන් විවිධ සැලැසුම් ක්‍රියාත්මක කරන ලදී. 2016 වන විටත් ඉලක්ක සම්පූර්ණයෙන් සපුරා ගත නොහැකි වූ බැවින්, ළමා ශ්‍රමයේ අනර්ථකාරී ස්වරූපයන් අවසන් කිරීම සඳහා ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2017 වසරේ දී එළි දක්වන ලදී. මෙ මගින් බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා විවිධ ආයතනය, සංවිධාන හා පුද්ගලයන් තිරස් හා සිරස් ලෙස සම්බන්ධීකරණය වෙමින් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වූ කාර්යයේ නියැලෙයි.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක වීම තුළ වර්තමානය වන විට ශ්‍රී ලංකාවෙ හි ළමා ශ්‍රමය ක්‍රියාත්මක වීම කුමන ස්වභාවයක පවතී ද යන්න අධ්‍යයනය කිරීම වැදගත් වේ. මෙහි එක් පියවරක් වශයෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ ළමා ශ්‍රමය පිළිබඳ මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

## <u>1.2 අරමුණු</u>

- 2024 වසර තුළ කොළඹ දිස්ත්‍රික්කය පාදක කර ගනිමින් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘති සිදු වෙමින් පවතින බැවින්, එම දිස්ත්‍රික්කය තුළ දැනට පවතින ළමා ශ්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම
- ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ක්‍රියාකාරකම් හි ප්‍රගතිය ඇගයීම
- ළමා ශ්‍රමිකයන් සිටින පවුල්වල සමාජ ආර්ථික තත්වය පිළිබඳ දත්ත රැස් කිරීම
- ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව අධ්‍යයනය කිරීම

## 1.3 සංකල්ප සහ නිර්වචන

### 1.3.1 දරුවා

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව වයස අවුරුදු 18ට අඩු පුද්ගලයකු දරුවෙකු ලෙස හැඳින්වේ. 1956 අංක 47 දරන "ස්ත්‍රීන් තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම" පිළිබඳ පනත ට අනුව වයස අවුරුදු 16 ට අඩු පුද්ගලයකු ළමයෙකු ලෙස ද, වයස අවුරුදු 16 සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු 18 අඩු පුද්ගලයකු තරුණ අයෙකු ලෙස ද හැඳින්වේ.

### 1.3.2 ළමා ශ්‍රමය මැනිම සඳහා ඉලක්ක ගත ජනගහනය

සංඛ්‍යාලේඛනඥවරුන්ගේ 18 වැනි ජාත්‍යන්තර සමුළුවට අනුව ළමා ශ්‍රමය මැනීම සඳහා ඉලක්ක ගත ජනගහනය වයස අවුරුදු 5-17 වයස් කාණ්ඩයට අයත් සියලුම අයගෙන් සමන්විත වේ.

### 1.3.3 රැකියාවේ යෙදී සිටින දරුවා

සංඛ්‍යාලේඛනඥවරුන්ගේ 18 වැනි ජාත්‍යන්තර සමුළුවට අනුව රැකියාවක යෙදී සිටින දරුවෙකු යනු, යොමු කාලය තුළ අවම වශයෙන් පැයක් වත් කුමන හෝ ආර්ථික කටයුත්තක යෙදී සිටින දරුවන් වේ. මෙහි දී ආර්ථික කටයුතු ලෙස ජාතික ගිණුම් ක්‍රමයේ අර්ථ දක්වා ඇති සාමාන්‍ය නිෂ්පාදන සීමාව තුළ ට වැටෙන ක්‍රියාකාරකම් සලකා බලනු ලැබේ.

### 1.3.4 සේවකයා

රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සේවායෝජකයෙකු වෙනුවෙන් සේවය කරන සහ වැටුප් මත, කොමිස් මත, කැලි පදනම මත හෝ වෙනත් ආකාරයක ට වැටුප් ලබන පුද්ගලයෙකු සේවකයෙකු ලෙස සැලකේ.

### 1.3.5 සේවායෝජකයා

තමාගේ ම ආර්ථික ව්‍යාපාරයක් ක්‍රියාත්මක කරන, හෝ ස්වාධීන ව වෘත්තියක හෝ වෙළදාමක නියැලෙන සහ එක් සේවකයෙකු හෝ වැඩි ගණනක් සේවයේ යොදවා ගෙන ඇති පුද්ගලයෙකු සේවායෝජකයෙකු ලෙස සැලකේ.

### 1.3.6 තමන්ගේ ම ආර්ථික කටයුතු කරන්නා

පවුලේ සාමාජිකයන්ගේ සහය ඇති ව හෝ නැති ව තමන්ගේ ම ආර්ථික ව්‍යාපාරයක් පවත්වාගෙන යන සහ එක් සේවකයකු හෝ සේවයට බඳවා ගෙන නොමැති පුද්ගලයෙකු තමන්ගේ ම ආර්ථික කටයුතු කරන්නෙකු ලෙස සැලකේ.

### 1.3.7 පවුලේ ආර්ථික කටයුතු සඳහා සහය වන්නා

සාමාන්‍යයෙන් එකම නිවසක ජීවත් වන, ආශ්‍රිත පුද්ගලයෙකු විසින් පවත්වාගෙන යනු ලබන ආර්ථික ව්‍යවසායක වැටුප් නොමැති ව සේවය කරන පුද්ගලයෙකු පවුලේ ආර්ථික කටයුතු සඳහා දායකවන්නකු ලෙස සැලකේ.

## 1.4. යොමු කාලය

2024 වසරේ ජුනි සහ ජුලි මාස වල දී දත්ත රැස් කිරීම සිදු කල අතර දත්ත රැස් කරන ලද සතිය ට පෙර සතිය යොමු කාලය ලෙස සලකා තොරතුරු රැස් කිරීම සිදු කරන ලදී.

## 1.5 විෂය පථය සහ ආවරණය

### 1.5.1 සමීක්ෂණ ජනගහනය

ළමා ශ්‍රමය පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේමූලික සම්මුතීන් දෙකෙහි ප්‍රධාන අරමුණු වලට අනුව හා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක අනිවාර්ය අධ්‍යාපන වයස ද සළකා, 2021 අංක 2 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ (සංශෝධන) පනත මඟින් පුද්ගලයෙකු සේවයේ යෙදවීමේ අවම වයස අවුරුදු 16 ලෙස ද, අවුරුදු 18 ට අඩු කිසිම තැනැත්තෙක් අන්තරායකාරී රැකියාවල යෙදවිය නොහැකි බව ද, තීරණය කර ඇත.

ළමා ශ්‍රමය මැනීම සඳහා ඉලක්කගත ජනගහනය අවුරුදු 5-17 දක්වා වන බැවින්, මෙම අධ්‍යයනයේ දී අවුරුදු 5-17 දක්වා වයස් කාණ්ඩවල ළමුන් පිළිබඳ ස විස්තරාත්මක තොරතුරු එක්රැස් කර ඇත.

### 1.5.2 භූගෝලීය ආවරණය

කොළඹ දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 කින් සමන්විත වේ. භූගෝලීය වශයෙන් මෙම සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් ග්‍රාම නිලධාරි වසම් 100 ක් තුළින් ගෘහ ඒකක 1000 ක් තෝරා ගන්නා ලදී.

## 1.6 අධ්‍යයන ක්‍රමවේදය

කොළඹ දිස්ත්‍රික්කය තුළ ළමා ශ්‍රමය තුරන් කිරීමේ වැඩසටහන් හි ප්‍රගතිය පිළිබඳ අබෝධයක් ලබා ගැනීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. එබැවින් මේ සඳහා වඩාත් ඵලදායී මෙවලමක් ලෙස **ගෘහ ඒකක සමීක්ෂණ ක්‍රමය** තෝරා ගන්නා ලදී. මෙම

ක්‍රමයේ දී සසම්භාවී ව තෝරා ගන්නා ලද නිවාස ඒකක වෙත ප්‍රශ්නාවලියක් යොමු කිරීම මගින් දත්ත රැස් කිරීම සිදු කරන ලදී.

කොළඹ දිස්ත්‍රික්කය තුළ ළමා ශ්‍රමිකයන් ඇතැම් කුඩා භූමි ප්‍රදේශ තුළට පමණක් කේන්ද්‍රගතව සිටිය හැකි බැවින් හා ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමිකයින්

ඉතා සුළු වශයෙන් වාර්තා වී ඇති බැවින්, ළමා ශ්‍රමිකයන්ගේ ලාක්ෂණිකයන් අධ්‍යයනය සඳහා ඔවුන් කේන්ද්‍රගත ව සිටිය හැකි යැයි හඳුනා ගත් ප්‍රදේශයන් තෝරා එවැනි ප්‍රදේශයන් හි ළමා ශ්‍රමිකයන්ගෙන් හා ඔවුන්ගේ පවුල් හා ආශ්‍රිතයන්ගෙන් **කඩිනම් තක්සේරු අධ්‍යයනයක්** මගින් දත්ත ලබා ගන්නා ලදී. මෙ මගින් ළමා ශ්‍රමිකයන්ගේ අධ්‍යාපන තොරතුරු, රැකියා ආශ්‍රිත තොරතුරු හා සමාජයීය තොරතුරු රැස් කර ගැනීම අරමුණ විය.

### 1.6.1 ප්‍රශ්නාවලිය

මේ සඳහා භාවිතා කරන ලද ප්‍රශ්නාවලිය; හඳුනා ගැනීමේ තොරතුරු, අධ්‍යාපන තොරතුරු හා ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත විය.

i. හඳුනා ගැනීමේ තොරතුරු :
මෙහි දී නිවසේ පදිංචි සියලුම පුද්ගලයන්ගෙන් මූලික තොරතුරු ලබා ගන්නා ලදී.

ii. අධ්‍යාපන තොරතුරු :
අධ්‍යයනයේ ඉලක්කගත ජනගහනය වන වයස අවුරුදු 5-17 දක්වා දරුවන්ගෙන් අධ්‍යාපන තොරතුරු රැස් කරන ලදී.

iii. ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු :
වයස අවුරුදු 5-17 දක්වා දරුවන් අතරින් ආර්ථික කටයුතු සිදු කරන්නේ යැයි හඳුනාගන්නා ලද දරුවන්ගෙන්, ඔවුන් විසින් සිදු කරනු ලබන ආර්ථික කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලදී.

### 1.6.2 දත්ත රැස් කිරීම

දත්ත රැස් කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශයේ නිලධාරීන් විසින් සිදු කරන ලද අතර ඒ සඳහා ඍජු සම්මුඛ පරීක්ෂණ ක්‍රමය භාවිතා කරන ලදී. CSPro මෘදුකාංගය මගින් සකස් කරන ලද උපකාරක යෙදවුමක් (App) යොදා ගනිමින් නිලධාරීන් කණ්ඩායම් වශයෙන් ක්ෂේත්‍රයට ගොස් දත්ත රැස් කිරීම සිදු කරන ලදී.

### 1.6.3 ඒකක සංඛ්‍යාව තෝරා ගැනීම

මෙම අධ්‍යයනය සඳහා **ගෘහ ඒකක සමීක්ෂණ ක්‍රමය මෙන් ම කඩිනම් තක්සේරු** අධ්‍යයන **ක්‍රමය** භාවිතා කරන ලදී. එබැවින් අධ්‍යයන ක්‍රමවේදයන් අනුව ඒකක සංඛ්‍යාව තෝරා ගන්නා ලදී.

1. ගෘහ ඒකක සමීක්ෂණ ක්‍රමය:
මේ සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුවේ ඡන්ද හිමි නාම ලේඛනයේ 2023 වසරේ ලියාපදිංචි පවුල් සංඛ්‍යාව පදනම් කර ගනිමින් නිවාස ඒකක 1000ක් තෝරා ගන්නා ලදී. මෙම ක්‍රමයේ දී අධ්‍යයන ඒකක තෝරා ගැනීම පියවර දෙකක දී සිදු කරන ලදී.

පියවර 01- එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි ලියාපදිංචි පවුල් සංඛ්‍යාව පදනම් කර ගනිමින් සසම්භාවී ව (Randomly) ග්‍රාම නිලධාරි වසම් 100ක් තෝරා ගැනීම

පියවර 02- තෝරා ගන්නා ලද ග්‍රාම නිලධාරි වසම් 100 න්, ක්‍රමික නියැදීමමගින් (Systematic sampling) එක් වසමකින් ඒකක 10 බැගින් ඒකක 1000ක් තෝරා ගැනීම

**වගුව 1.1: සමීක්ෂණ ඒකක සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව | ඒකක සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 11 | 110 |
| කොලොන්නාව | 8 | 80 |
| කඩුවෙල | 11 | 110 |
| හෝමාගම | 12 | 120 |
| පාදුක්ක | 4 | 40 |
| සීතාවක | 6 | 60 |
| මහරගම | 8 | 80 |
| ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ | 4 | 40 |
| තිඹිරිගස්යාය | 9 | 90 |
| දෙහිවල | 4 | 40 |
| රත්මලාන | 4 | 40 |
| මොරටුව | 8 | 80 |
| කැස්බෑව | 11 | 110 |
| එකතුව | 100 | 1000 |

2. කඩිනම් තක්සේරු අධ්‍යයන ක්‍රමය: මෙම ක්‍රමයේ දී කොළඹ දිස්ත්‍රික්කය තුළ ළමා ශ්‍රමය ව්‍යාප්ත ව පවතී යැයි හඳුනා ගත් කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ලුනුපොකුණ, බ්ලූමැන්ඩල් හා මහවත්ත යන ග්‍රාම නිලධාරි වසම් තුන හා කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සේදවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය තෝරා ගන්නා ලදී.

1.6.4 **සීමාවන්**

- දත්ත රැස් කිරීමේ කාර්යයේ දී සමීක්ෂණයක් මගින් දත්ත රැස් කිරීම ට නිවැරදි, යාවත්කාලීන වූ නියදි රාමුවක් අවශ්‍ය වේ. මේ සඳහා භාවිතා කරන ලද නියැදි රාමුව සමීක්ෂණයක් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් නොවූ බැවින්, අධ්‍යයනයක් පමණක් සිදු කිරීම.
- ළමා ශ්‍රමය පිළිබඳ ඇස්තමේන්තු ඉදිරිපත් කළ නොහැකි වීම.
- අධ්‍යයනය කොළඹ දිස්ත්‍රික්කය තුළ පමණක් සිදු කළ බැවින් සමස්ත දිවයිනෙ හි ළමා ශ්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට නොහැකි වීම.
- ශ්‍රී ලංකාවෙ හි ළමා ශ්‍රමිකයන් ඉතා සීමිත බැවින්, හඳුනාගත් ළමා ශ්‍රමිකයන් සංඛ්‍යාව ළමා ශ්‍රමිකයන්ගේ ලාක්ෂණිකයන් අධ්‍යයනය සඳහා ප්‍රමාණවත් නොවීම.

# 2 පරිච්ඡේදය

## ළමා ජනගහනය

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව වයස අවුරුදු 18ට අඩු සියලුම පුද්ගලයන් දරුවන් වේ.

සංඛ්‍යාලේඛනඥවරුන්ගේ 18 වැනි ජාත්‍යන්තර සමුළුව ට අනුව ළමා ශ්‍රමය මැනීමේ දී ඉලක්කගත ළමා ජනගහනය යනු වයස අවුරුදු 5-17 දක්වා දරුවන් වේ.

මෙම පරිච්ඡේදයේ දී ළමා ශ්‍රමය මැනීමේ ඉලක්කගත ජනගහනය වන වයස අවුරුදු 5-17 දක්වා ජනගහනය පිළිබඳ දත්ත ඉදිරිපත් කරයි. ස්ත්‍රී පුරුෂ භාවය අනුව ළමා ජනගහනය, වයස් කාණ්ඩ අනුව ළමා ජනගහනය, අධ්‍යාපන මට්ටම, පාසල් පැමිණීමේ හා නො පැමිණීමේ තත්ත්වය, නොපැමිණේ නම් ඊට හේතු ආදිය මෙහි දී සාකච්ඡා කෙරේ.


මෙම අධ්‍යයනයේ දී කොළඹ දිස්ත්‍රික්කය තුළ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන සේ නිවාස ඒකක 1000 ක් තෝරා ගන්නා ලදී. ඒ අතරින් ප්‍රතිචාර දක්වන ලද ඒකක සංඛ්‍යාව 975 කි. මෙම නිවාසයන් හි සාමාන්‍ය පදිංචිය පදනම් කර ගනිමින් ජනගහනය පිළිබඳ දත්ත රැස් කරන ලදී. ඒ අනුව පදිංචි මුළු ජනගහනය 3672 ක් වූ අතර එයින් ඉලක්කගත ළමා ජනගහනය (වයස අවුරුදු 5-17 දක්වා) 614 ක් විය.

### 2.1 ළමා ජනගහනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ දී සිදු කරන ලද ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය ට අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ මුළු ජනගහනය 2,292,314 කි. එයින් 450,096 ක් එනම්, 19.6% ක් ළමා ජනගහනය විය.

ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024 ට අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ මුළු ජනගහනයෙන් 16.7% ක් ළමා ජනගහනය විය. ප්‍රස්තාර අංක 2.1 මගින් ඒ බව පැහැදිලි ව ඉදිරිපත් කර ඇත.


**ප්‍රස්තාර අංක 2.1: මුළු ජනගහනය ට අනුව ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය)**




### 2.2 ස්ත්‍රී පුරුෂ භාවය අනුව ළමා ජනගහනය

ප්‍රස්තාර අංක 2.2 මගින් ස්ත්‍රී පුරුෂ භාවය අනුව ළමා ජනගහනය පෙන්නුම් කරයි. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ ළමා ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් ගැහැණු දරුවන් වේ. එය 51% ක ප්‍රමාණයකි. පිරිමි දරුවන් 49% කි.

**ප්‍රස්තාර අංක 2.2: ස්ත්‍රී පුරුෂ භාවය අනුව ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය)**




## 2.3 වයස් කාණ්ඩ අනුව ළමා ජනගහනය

ළමා ජනගහනය වයස් කාණ්ඩ අනුව වර්ග කිරීමේ දී ප්‍රධාන වයස් කාණ්ඩ තුනක් යටතේ වර්ග කරන ලදී.


1 වයස අවුරුදු 5-11 දක්වා ජනගහනය (ප්‍රාථමික අධ්‍යාපනය ලබන දරුවන්)

2 වයස අවුරුදු 12-15 දක්වා ජනගහනය (ප්‍රාථමික අධ්‍යාපනයෙන් පසු රැකියා සඳහා පිවිසෙන අවම වයස් මට්ටම දක්වා)

3 වයස අවුරුදු 16-18 අඩු ජනගහනය (තරුණ ජනගහනය)

අධ්‍යයනයට අනුව වයස් කාණ්ඩ අනුව ළමා ජනගහනය ප්‍රස්තාර අංක 2.3 මගින් පැහැදිලිව ඉදිරිපත් කර ඇත. ඒ අනුව ළමා ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් අයත් වන්නේ වයස අවුරුදු 5-11 දක්වා වයස් කාණ්ඩය ට ය. එම අගය 47.2% කි. වයස අවුරුදු 12-15 දක්වා වයස් කාණ්ඩය ට අයත් වන පිරිස 35% ක් වන අතර තරුණ දරුවන් සංඛ්‍යාව (වයස අවුරුදු 16-18 අඩු වයස් කාණ්ඩය) 17.8% කි.

**ප්‍රස්තාර අංක 2.3: වයස් කාණ්ඩ අනුව ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය)**




**වගු අංක 2.1: වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය)**


| ස්ත්‍රී පුරුෂ භාවය | එකතුව % | 5-11 දක්වා ජනගහනය % | 12-15 දක්වා ජනගහනය % | 16-18 ට අඩු ජනගහනය % |
|---|---|---|---|---|
| *එකතුව* | 100 | 47.2 | 35.0 | 17.8 |
| *පිරිමි* | 100 | 47.5 | 33.6 | 18.9 |
| *ගැහැණු* | 100 | 47.0 | 36.4 | 16.6 |

ස්ත්‍රී පුරුෂ භාවය අනුව එක් එක් වයස් කාණ්ඩය ට අයත් ජනගහනය වගු අංක 2.1 මගින් පැහැදිලි ව ඉදිරිපත් කර ඇත. ඒ අනුව පිරිමි හා ගැහැණු දරුවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් වයස අවුරුදු 5-11 වයස් කාණ්ඩය ට අයත් වේ. පිරිමි දරුවන්ගෙන් 47.5% ක් හා ගැහැණු දරුවන්ගෙන් 47% ක් මෙම කාණ්ඩයට අයත් වේ. අඩුම ප්‍රතිශතයක් වාර්තා වන්නේ අවුරුදු 16-18 ට අඩු වයස් කාණ්ඩය තුළිනි. වයස අවුරුදු 12-15 දක්වා වයස් කාණ්ඩයට පිරිමි දරුවන්ගෙන් 33.6% ක් හා ගැහැණු දරුවන්ගෙන් 36.4% ක් අයත් වේ.

ප්‍රස්තාර අංක 2.4 මගින් එක් එක් වයස් කාණ්ඩය ට අයත් ළමා ජනගහනය ස්ත්‍රී පුරුෂ භාවය අනුව ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, වයස අවුරුදු 5-11 හා 12-15 කාණ්ඩයන් හි ගැහැණු දරුවන් වැඩි ප්‍රතිශතයක් වාර්තා වන අතර 16-17 කාණ්ඩයෙ හි පිරිමි දරුවන් වැඩි ප්‍රතිශතයක් වාර්තා වී ඇත.

**ප්‍රස්තාර අංක 2.4: වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය)**




## 2.4 පාසල් අධ්‍යාපනය ලබන හා නො ලබන ළමා ජනගහනය

ළමා ශ්‍රමය දරුවන්ගේ පාසල් අධ්‍යාපනය කෙරෙහි සෘජුව ම බලපාන සාධකයකි. දරුවන් ආර්ථික කටයුතුවල නිරත වීම ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු අතර මග නතර වීමට හෝ අධ්‍යාපනය සඳහා යොදවන කාලය අඩු වීමට හේතු වේ.

මෙ මගින් ඔවුන්ගේ අධ්‍යාපනික සංවර්ධනය හා අනාගත අපේක්ෂාවන් ට බාධා කරමින් දරිද්‍රතාවයේ චක්‍රය අඛණ්ඩ ව පවත්වාගෙන යාමට හේතු වේ. එසේ ම විධිමත් අධ්‍යාපනය මගින් ලබා දෙන කුසලතා හා සුදුසුකම් මග හැරිය හැකි බැවින් ඔවුන්ගේ අනාගත රැකියා අවස්ථා සීමා වීම, ශ්‍රමය සූරාකෑමට ලක්වීම, විවිධ අපයෝජනයන් ට ගොදුරු වීම වැනි අවදානම් තත්වයන් ට මුහුණපෑමට සිදු විය හැක. එ බැවින් ළමා ශ්‍රමය නිසා අධ්‍යාපන අවස්ථා නො ලැබීම මෙන් ම අධ්‍යාපන අවස්ථා නො ලැබීම හේතුවෙන් ළමයින්ගේ අනාගතය අනාරක්ෂිත වීම ද සිදු වේ.

වගු අංක 2.2 මගින් ඉදිරිපත් කරනු ලබන්නේ ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය 2016 ට අනුව හා ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024 ට අනුව ළමා ජනගහනයෙන් පාසල් යන හා නො යන දරුවන් පිළිබඳ තොරතුරු වේ.


ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය 2016 ට අනුව ශ්‍රී ලංකාව තුළ ළමා ජනගහනයෙන් 9.9% ක් පාසල් නො යන දරුවන් වේ. කොළඹ දිස්ත්‍රික්කය තුළ එම අගය 10.3% කි. 2024 අධ්‍යයන වාර්තාව ට අනුව පාසල් නො යන දරුවන්ගේ ප්‍රතිශතය 3.9% කි.

**වගුව අංක 2.2: ළමා ජනගහනයෙන් පාසල් යන හා නො යන දරුවන්ගේ ප්‍රතිශතය**

| මූලාශ්‍රය | ප්‍රදේශය | එකතුව % | පාසල් යන දරුවන් % | පාසල් නො යන දරුවන් % |
|---|---|---|---|---|
| *ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය 2016* | ශ්‍රී ලංකාව | 100.0 | 90.1 | 9.9 |
| *ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය 2016* | කොළඹ දිස්ත්‍රික්කය | 100.0 | 89.7 | 10.3 |
| *ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024* | කොළඹ දිස්ත්‍රික්කය | 100.0 | 96.1 | 3.9 |

අවුරුදු 5-17 කාණ්ඩයේ දරුවන්ගෙන් පාසල් නොයන ප්‍රතිශතය 3.9% කි. මෙයින් 2.3% ක් පාසල ට භාර ගන්නා දිනය වන විට වයස සම්පූර්ණ නො වීම නිසා පාසල් නො යන අතර 1.6% ක් දැනට පාසල් නො යන දරුවන් වේ. මෙම දරුවන්ගෙන් 1.3% ක් කිසිදු කාර්යයක නිරත නොවන දරුවන් වන අතර කුමන හෝ ආර්ථික කටයුත්තක නිරත වන දරුවන් සංඛ්‍යාව 0.3% කි. ප්‍රස්තාර අංක 2.5 මගින් මේ බව පැහැදිලි ව ඉදිරිපත් කර ඇත.

**ප්‍රස්තාර අංක 2.5: පාසල් යන හා නොයන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය)**





වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව පාසල් යන හා පාසල් නොයන දරුවන් පිළිබඳ තොරතුරු වගු අංක 2.3 මගින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව වයස අවුරුදු 5-11 වයස් කාණ්ඩයෙන් 4.8% ක් සහ වයස අවුරුදු 12-18 අඩු වයස් කාණ්ඩයෙන් 3.1% ක් පාසල් නො යන දරුවන් ලෙස වාර්තා වී ඇත.

**වගු අංක 2.3: පාසල් යන හා නො යන දරුවන්ගේ ප්‍රතිශතය වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව (කොළඹ දිස්ත්‍රික්කය)**

| | එකතුව % | පාසල් යන % | පාසල් නොයන % |
|---|---|---|---|
| වයස් කාණ්ඩ අනුව | | | |
| *5-11* | 100.0 | 95.2 | 4.8 |
| *12-17* | 100.0 | 96.9 | 3.1 |
| *එකතුව* | 100.0 | 96.1 | 3.9 |
| *ස්ත්‍රී පුරුෂ භාවය අනුව* | | | |
| *පිරිමි* | 100.0 | 95.3 | 4.7 |
| *ගැහැණු* | 100.0 | 96.8 | 3.2 |
| *එකතුව* | 100.0 | 96.1 | 3.9 |


ඉහත වගුවට අනුව පිරිමි දරුවන්ගෙන් 4.7% ක් සහ ගැහැණු දරුවන්ගෙන් 3.2% ක් පාසල් නොයන දරුවන් වේ. මෙය ප්‍රස්තාර අංක 2.6 මගින් වඩාත් පැහැදිලි ව දක්වා ඇත.

**ප්‍රස්තාර අංක 2.6: පාසල් අධ්‍යාපනය ලබන හා නො ලබන ළමා ජනගහනය ස්ත්‍රී පුරුෂ භාවය අනුව**




පාසල් නො යන දරුවන්ගේ ප්‍රතිශතය ස්ත්‍රී පුරුෂ භාවය අනුව ප්‍රස්තාර අංක 2.7 මගින් පෙන්නුම් කරයි. ඒ අනුව පාසල් නො යන දරුවන් අතරින් වැඩිම ප්‍රතිශතය පිරිමි දරුවන් වේ. එහි ප්‍රතිශතය 58.3% කි. පාසල් නො යන ගැහැණු දරුවන්ගේ ප්‍රතිශතය 41.7% කි.

**ප්‍රස්තාර අංක 2.7: පාසල් අධ්‍යාපනය නො ලබන ළමා ජනගහනය ස්ත්‍රී පුරුෂ භාවය අනුව**




දරුවන් මෙසේ පාසල් නො පැමිණීම සඳහා විවිධ හේතූන් බලපා ඇත. එම හේතු අතර ආර්ථික දුෂ්කරතා සහ පාසල් අධ්‍යාපනය සඳහා දුර්වල වීම වැඩි වශයෙන් බලපා ඇති අතර 2019, 2020 වර්ෂ තුළ ව්‍යාප්ත වූ කොරෝනා වසංගත තත්ත්වය මෙන් ම ආබාධිත තත්ත්වයන් ද ඊට බලපා ඇති බව අධ්‍යයනයෙන් පැහැදිලි විය.

# 3 පරිච්ඡේදය

## වැඩ කරන ළමා ජනගහනය

සංඛ්‍යාලේඛනඥවරුන්ගේ 18 වැනි ජාත්‍යන්තර සමුළුව ට අනුව වැඩ කරන ළමා ජනගහනය යනු යොමු කාලය තුළ දී අවම වශයෙන් පැයක් හෝ කිසියම් ආර්ථික කටයුත්තක නිරත වූ දරුවන් වේ. (යොමු කාලය යනු ක්ෂේත්‍ර කටයුතු සිදු කරන සතිය ට පෙර සතිය වේ).

කිසියම් ආර්ථික කටයුත්තක් යනු සේවකයෙක් ලෙස, සේවායෝජකයෙක් ලෙස, තමාගේ ම ආර්ථික කටයුතු වල නිරත වන්නෙක් ලෙස, හෝ වැටුප් නො ලබා පවුලේ ආර්ථික කටයුතු සඳහා දායක වන්නෙක් ලෙස යන කුමන හෝ ආකාරයක ආර්ථික කටයුත්තක නිරත වීමයි.

දරුවාගේ සෞඛ්‍ය ට, ආරක්ෂාව ට හෝ ඔවුන් ගේ පාසල් අධ්‍යාපනය ට හෝ මානසික සංවර්ධනය ට බාධාවක් නොවන සැහැල්ලු වැඩවල දරුවන් ට නිරත විය හැකි ය. එබැවින්, වැඩකරන සියලුම දරුවන් ළමා ශ්‍රමිකයන් නොවේ.

ළමා ශ්‍රමයෙන් තොර ආරක්ෂිත පරිසරයක වැඩ කිරීම මගින් දරුවන්ගේ

- ප්‍රායෝගික කුසලතා වර්ධනය වීම
- වගකීම් දැරීම ට ඇති හැකියාව වර්ධනය වීම
- ව්‍යවසායකත්වය, කාල කළමනාකරනය සහ ගැටලු විසඳීමේ හැකියාවන් පෝෂණය වීම
- ජාතියේ ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම මගින් ආර්ථික තරගකාරිත්වය ඉහළ නැංවීම
- පවුලේ ආර්ථිකයට දායක වීමට හැකි වීම

ආදී ධනාත්මක ප්‍රතිඵල සඳහා හේතු වේ. එ බැවින් ළමා ශ්‍රමයෙන් තොර වැඩ කරන ළමා ජනගහනය යනු රටක අනාගතය තීරණය කරන වැදගත් සාධකය කි. කුටුම්බයන්ගේ මෙන් ම රටේ ආර්ථික වර්ධනය ට හා සංවර්ධනය ට එයින් මහඟු දායකත්වයක් ලැබේ. එම ශ්‍රම බලකාය සැලසුම් සහගත ව කළමනාකරනය කිරිම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම අනාගත ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වැදගත් පියවරක් වනු ඇත.

### 3.1 වැඩ කරන ළමා ජනගහනය ළමා ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ දී සිදුකරන ලද ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය ට අනුව ශ්‍රී ලංකාව තුළ ළමා ජනගහනයෙන් 2.3% ක් වැඩ කරන ළමා ජනගහනය විය. එය කොළඹ දිස්ත්‍රික්කය තුළ 1.5% කි.

ළමා ශ්‍රමය පිළිබඳ 2024 අධ්‍යයනයට අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ ළමා ජනගහනය 16.7% ක් වන අතර එයින් 2.3% ක් වැඩකරන ළමා ජනගහනය ලෙස වාර්තා වී ඇත. (වගු අංක 3.1)


*වගුව අංක 3.1: වැඩකරන ළමා ජනගහනය ළමා ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස*

| මූලාශ්‍රය | ප්‍රදේශය | ළමා ජනගහනය % | වැඩ කරන ළමා ජනගහනය % |
|---|---|---|---|
| *ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය 2016* | ශ්‍රී ලංකාව | 22.2 | 2.3 |
| *ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය 2016* | කොළඹ දිස්ත්‍රික්කය | 19.6 | 1.5 |
| *ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024* | කොළඹ දිස්ත්‍රික්කය | 16.7 | 2.3 |

### 3.2 ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩ කරන ළමා ජනගහනය

වැඩකරන දරුවන් අතරින් වැඩිම ප්‍රමාණය පිරිමි දරුවන් වේ. ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය 2016 ට අනුව ශ්‍රී ලංකාව තුළ වැඩ කරන ළමා ජනගහනයෙන් 66.7% ක් පිරිමි දරුවන් විය. ගැහැණු දරුවන් 33.3% කි.

**ප්‍රස්තාර අංක 3.1: ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩකරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය)**





ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024 ට අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩ කරන ළමා ජනගහනය ප්‍රස්තාර අංක 3.1 මගින් පැහැදිලි කරයි. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ ළමා ජනගහනයෙන් වැඩිම ප්‍රතිශතය ගැහැණු දරුවන් වුව ද, වැඩ කරන ළමා ජනගහනයෙන් වැඩිම ප්‍රතිශතය පිරිමි දරුවන් වේ. එය 64.3% ක ප්‍රතිශතයකි. ගැහැණු දරුවන්ගේ ප්‍රතිශතය 35.7% කි.

### 3.3 වයස් කාණ්ඩ අනුව වැඩ කරන ළමා ජනගහනය

වයස් කාණ්ඩ අනුව වැඩ කරන ළමා ජනගහනය අංක 3.2 ප්‍රස්තාර සටහනින් ඉදිරිපත් කර ඇත.

**ප්‍රස්තාර අංක 3.2: වයස් කාණ්ඩ අනුව වැඩ කරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය)**




ඒ අනුව වැඩ කරන දරුවන්ගෙන් වැඩිම පිරිසක් වයස අවුරුදු 16-18 ට අඩු වයස් කාණ්ඩයෙන් වාර්තා විය. එය සමස්ත ළමා ජනගහනයෙන් 1.1% කි. වැඩකරන ළමා ජනගහනයෙන් 50% ක් මෙම කාණ්ඩය ට අයත් වේ. මෙම වයස් කාණ්ඩය තුළ ට අවම වයස් අවශ්‍යතා සපුරා ඇති යෞවනයන් අයත් වේ.

**වගු අංක 3.2: වයස් කාණ්ඩ අනුව හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩ කරන ළමා ජනගහනය සමස්ත ළමා ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස (කොළඹ දිස්ත්‍රික්කය)**

| *වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂ භාවය* | *වැඩ කරන ළමා ජනගහනය %* |
|---|---|
| *වයස් කාණ්ඩ අනුව* | |
| *5-11* | 0.3 |
| *12-15* | 0.8 |
| *16-17* | 1.1 |
| *එකතුව* | 2.3 |
| *ස්ත්‍රී පුරුෂ භාවය අනුව* | |
| *පිරිමි* | 1.5 |
| *ගැහැණු* | 0.8 |
| *එකතුව* | 2.3 |


මෙම අධ්‍යයනයට අනුව වයස අවුරුදු 5-11 දක්වා වයස් කාණ්ඩය තුළ ද වැඩ කරන දරුවන් වාර්තා විය. එය සමස්ත ළමා ජනගහනයෙන් 0.3% ක පමණ ඉතා සුළු ප්‍රමාණයකි. මෙම වයස් කාණ්ඩය තුළ වැඩි වශයෙන් පවුලේ ආර්ථික කටයුතු සඳහා දායක වන දරුවන් ඇතුළත් වේ. ඇතැම් දරුවන් පාසල් නිවාඩු කාලය තුළ මව්පියන් සමග ඉතා සුළු කාලයක් මෙම කටයුතු වල නිරත වූ බව අධ්‍යානයේ දී පැහැදිලි විය. එය වැඩ කරන ළමා ජනගහනයෙන් 14.3% ක ප්‍රතිශතයකි. වයස අවුරුදු 12-15 වයස් කාණ්ඩය තුළ සමස්ත ළමා ජනගහනයෙන් 0.8% ක් වැඩ කරන ළමා ජනගහනය ලෙස වාර්තා විය. මෙය වැඩ කරන ළමා ජනගහනයෙන් 43% ක ප්‍රතිශතයකි. මෙම වයස් කාණ්ඩය තුළ දරුවන් විශේෂයෙන් ම දවසේ පාසල් කාලයෙන් පසුව ම කටයුතු සඳහා ඉතා සුළු කාලයක් නිරත වූ බව අධ්‍යයනයේ දී පැහැදිලි විය.

## 3.4 රැකියා තත්ත්වය අනුව වැඩ කරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය)

රැකියා පිළිබඳ ජාත්‍යන්තර වර්ගීකරණයන් ට අනුව ප්‍රධාන රැකියා තත්ත්ව හතරක් හඳුනා ගනී. එනම් සේවක, සේවායෝජක, තමාගේ ම ආර්ථික කටයුතු කරන හා වැටුප් නො ලබා පවුලේ ආර්ථික කටයුතු සඳහා දායක වන ලෙසයි.

මෙම අධ්‍යයනයේ දී සේවායෝජකයින් හැර අනිකුත් රැකියා තත්ත්ව යටතේ වැඩ කරන දරුවන් වාර්තා විය.

**ප්‍රස්තාර අංක 3.3:** රැකියා තත්ත්වය අනුව වැඩ කරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය)




**වගු අංක 3.3: රැකියා තත්ත්වය අනුව වැඩ කරන ළමා ජනගහනය මුළු ළමා ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස**

| *රැකියා තත්ත්වය* | වැඩ කරන ළමා ජනගහනය % |
|---|---|
| *සේවක* | 0.5 |
| *තමාගේ ආර්ථික කටයුතු කරන* | 0.2 |
| *පවුලේ ආර්ථික කටයුතු සඳහා දායකවන* | 1.6 |
| *එකතුව* | 2.3 |

ප්‍රස්තාර අංක 3.3 ට අනුව වැඩ කරන දරුවන්ගෙන් වැඩිම ප්‍රතිශතයක් පවුලේ ආර්ථික කටයුතු සඳහා දායකවන්නන් ය. වැඩ කරන ළමා ජනගහනයෙන් 71.4% ක් මීට අයත් වේ. එය සමස්ත ළමා ජනගහනයෙන් 1.6% කි. (වගු අංක 3.2)

ආයතනයක සේවකයන් ලෙස සේවය කරන දරුවන් ගේ ප්‍රතිශතය සමස්ත ළමා ජනගහනයෙන් 0.5% ක තරම් සුළු අගයක් ගන්නා අතර එය වැඩ කරන ළමා ජනගහනයෙන් 21.4% ක ප්‍රතිශතයකි.


මෙම අධ්‍යයනයට අනුව ළමා ජනගහනයෙන් 0.2% ක ප්‍රතිශතයක් තමාගේ ම ආර්ථික කටයුතු සිදු කරන දරුවන් බව වාර්තා වී ඇත. එම සංඛ්‍යාව වැඩ කරන ළමා ජනගහනයෙන් 7.1% ක ප්‍රමාණයකි.

**3.5 සතියක් තුළ වැඩ කරන කාලය අනුව වැඩ කරන ළමා ජනගහනය**

දරුවන් විසින් සිදු කරන රැකියාවෙ හි ස්වරූපය මෙන් ම ඔවුන් එම වැඩෙහි යෙදී සිටින කාලය ද ළමා ශ්‍රමය මැනීමේ වැදගත් සාධක වේ. එම නිසා මෙම අධ්‍යයනයේ දී දරුවන් විසින් සිදු කරන ආර්ථික කටයුත්තෙ හි ඔවුන් යෙදී සිටින කාලය පිළිබඳ දත්ත රැස් කරන ලදී. ප්‍රස්තාර අංක 3.4 මගින් මෙම දත්ත ඉදිරිපත් කර ඇත.

එම ප්‍රස්තාරයට අනුව වැඩි ම දරුවෝ සංඛ්‍යාවක් සතියකට පැය 5 සිට 24 දක්වා කාලය තුළ වැඩ කරති. එය වැඩ කරන ළමා ජනගහනයෙන් 64.3% ක ප්‍රතිශතයකි. සමස්ත ළමා ජනගහනයෙන් 1.5% ක ප්‍රතිශතයකි.

**ප්‍රස්තාර අංක 3.4:** සතියක් තුළ වැඩ කරන පැය ගණන අනුව වැඩකරන ළමා ජනගහනය (කොළඹ දිස්ත්‍රික්කය)




සතියකට පැය 5 ට වඩා අඩුවෙන් වැඩ කරන දරුවන් ගේ ප්‍රතිශතය 21.4% ක් වන අතර පැය 24 කට වඩා වැඩියෙන් වැඩ කරන ප්‍රතිශතය 14.2% කි.

දිගු පැය ගණනක් වැඩ කිරීම ජාත්‍යන්තර නිර්වචනයන් ට අනුව අනතුරුදායක රැකියා ගණයට අයත් වේ. වැඩකරන දරුවන්ගෙන් 7.1% ක් පැය 44 කට වඩා වැඩියෙන් වැඩ කරයි. මෙය සමස්ත ළමා ජනගහනයෙන් 0.1% ක ප්‍රතිශතයකි.

# 4 පරිච්ඡේදය

## ළමා ශ්‍රමිකයින් හා අනතුරුදායක රැකියාවල නිරත ළමා ශ්‍රමිකයින්

ළමයකු,

අ. දිනපතා පාසල ආරම්භ වීමේ විධිමත් වේලාවන් ට පෙර හෝ පාසල අවසන් වීමේ වේලාවට පසුව ඔහුගේ දෙමව්පියන් හෝ භාරකරු විසින්, ඒ පවුලේම සාමාජිකයන් විසින් කරගෙන යනු ලබන සැහැල්ලු කෘෂිකාර්මික හෝ උද්‍යාන වැඩ කටයුතු වල හෝ ඒ හා සමාන වැඩ කටයුතුවල හැර

හෝ

ආ. යම් රාජ්‍ය අධිකාරියක් විසින් අධීක්ෂණය කරනු ලබන්නා වූ සහ යම් වෙළෙඳාමක් හෝ රැකියාවක් සඳහා යම් තාක්ෂණික අධ්‍යයනයක් හෝ අන් පුහුණුවක් ලබා දෙන්නා වූ යම් පාසලක් හෝ අන් ආයතනයක හැර,

සේවයේ නියුක්ත කරවනු නොලැබිය යුතු ය.

2021 අංක 2 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීමේ (සංශෝධන) පනත

ජාත්‍යන්තර කම්කරු සංවිධානයට (ILO) අනුව, 2020 වන විට ලොව පුරා මිලියන 160 කට අධික ළමුන් සංඛ්‍යාවක් ළමා ශ්‍රමිකයන් ලෙස සේවයේ යෙදී ඇති අතර, මිලියන 79 කට ආසන්න සංඛ්‍යාවක් අන්තරායකර වැඩවල නිරත ව සිටී. අඩු ආදායම්ලාභී රටවල, විශේෂයෙන් ම උප සහරා අප්‍රිකා සහ දකුණු ආසියා රටවල ළමා ශ්‍රමිකයන් බහුල ව දක්නට ලැබේ.

ජාත්‍යන්තර කම්කරු සංවිධාන වාර්තා අනුව දකුණු ආසියාතික රටවල ළමා ශ්‍රමික සංඛ්‍යාව මිලියන 16.7 ලෙස ගණන් බලා ඇත. ඉන් වැඩිම සංඛ්‍යාව (මිලියන 5.8) ඉන්දියාවෙන් වාර්තා වන අතර බංග්ලාදේශය, පාකිස්ථානය, සහ නේපාලය වැනි රටවල වැඩි වශයෙන් ළමා ශ්‍රමය දක්නට ලැබේ.

දකුණු ආසියාතික රටවල් අතරින් ශ්‍රී ලංකාව ළමා ශ්‍රමිකයන් පිළිබඳ ගැටලුව සාර්ථක ව පාලනය කරන ලද රටකි. ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය 2016 ට අනුව ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමිකයන් ගණන 43,714 කි. එය 1% ක් තරම් සුළු ප්‍රතිශතයකි. එයින් 9% ක් අන්තරායකාරී රැකියාවල නියුතු ළමා ශ්‍රමිකයන් බව වාර්තා වී ඇත. එම වාර්තාව ට අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ ළමා ශ්‍රමික ප්‍රතිශතය 0.8% කි.

### 4.1. ළමා ශ්‍රමිකයන් හා අනතුරුදායක රැකියා

ළමා ශ්‍රමය පිළිබඳ මෙම අධ්‍යයන ප්‍රතිඵල වලට අනුව 2024 වසර තුළ කොළඹ දිස්ත්‍රික්කයෙහි ළමා ශ්‍රමිකයන් සංඛ්‍යාව 0.3% කි. මෙම දරුවන් කොළඹ දිස්ත්‍රික්කයෙහි මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වූ ප්‍රදේශයන්ගෙන් වාර්තා වූ අතර අනිකුත් ප්‍රදේශයන්ගෙන් කිසිදු ළමා ශ්‍රමිකයෙක් වාර්තා නොවීම විශේෂ තත්ත්වයකි.

0.3% ක් වූ ළමා ශ්‍රමිකයන්ගෙන් 0.1% ක ප්‍රතිශතයක් අන්තරායකාරී රැකියාවල නිරත බව වාර්තා විය. මෙම දරුවන් දෙමව්පිය රැකවරණය නොමැති හෝ මව්පියන් මත්ද්‍රව්‍ය සඳහා යොමු වූ, කොළඹ ජනාකීර්ණ ප්‍රදේශයන්ගෙන් වාර්තා විය.


වගු අංක 2 මගින් ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය 2016 හා ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024 ට අනුව ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමිකයන් හා කොළඹ දිස්ත්‍රික්කය තුළ ළමා ශ්‍රමිකයන් පිළිබඳ දත්ත ඉදිරිපත් කර ඇත.

***වගු අංක 4.1: ළමා ශ්‍රමිකයන් හා අනතුරුදායක වැඩවල නිරත ළමා ශ්‍රමිකයන්, ළමා ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස***

| *මූලාශ්‍රය* | ප්‍රදේශය | වැඩ කරන ළමා ජනගහනය % | ළමා ශ්‍රමිකයන් % | අනතුරුදායක රැකියා % |
|---|---|---|---|---|
| *ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය 2016* | ශ්‍රී ලංකාව | 2.3 | 1.0 | 0.9 |
| *ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය 2016* | කොළඹ දිස්ත්‍රික්කය | 1.5 | 0.8 | දත්ත ඉදිරිපත් කර නැත |
| *ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024* | කොළඹ දිස්ත්‍රික්කය | 2.3 | 0.3 | 0.1 |

*ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය 2016 සඳහා ළමා ශ්‍රමිකයන් හඳුනාගැනීමේ දී ජාත්‍යන්තර නිර්වචනයන් හා ප්‍රමිතීන් භාවිතා කර ඇති නමුත් ළමා ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය 2024 සඳහා භාවිතා කරන ලද්දේ කම්කරු දෙපාර්තමේන්තුව විසින් ළමා ශ්‍රමිකයන් හඳුනාගැනීම සඳහා භාවිත කරනු ලබන නිර්වචනයන් වේ.*

**ප්‍රස්තාර අංක 4.1: ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය-2008/09, ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය-2016 හා ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය-2024 ට අනුව ළමා ශ්‍රමික ප්‍රතිශතය (කොළඹ දිස්ත්‍රික්කය)**




4.1. ප්‍රස්තාරය මගින් පැහැදිලි කරනු ලබන්නේ ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය 2008/09, ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය 2016 හා ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024 ට අනුව වැඩ කරන ළමා ජනගහනය හා ළමා ශ්‍රමික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු වේ. ඒ අනුව 2008 වසරේ දී කොළඹ දිස්ත්‍රික්කය තුළ 7.7% ක් වූ වැඩ කරන ළමා ජනගහනය 2016 දී 1.5% දක්වා අඩු වී ඇත. එහෙත් 2024 ළමා ශ්‍රමය පිළිබඳ මෙම අධ්‍යයනයට අනුව එය 2.3% ක් ලෙස වාර්තා වී ඇත.

එසේ වුවද, ළමා ශ්‍රමිකයින් සංඛ්‍යාව 2008 වසරේ සිට ක්‍රමිකව අඩු වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණයට අනුව 2008 දී 3.1% ක් වූ ළමා ශ්‍රමිකයින් සංඛ්‍යාව 2016 දී 0.8% දක්වා අඩු වී ඇත. ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනයට අනුව 2024 දී එම අගය 0.3% දක්වා අඩු වීමක් පෙන්නුම් කරයි.

### 4.2. ළමා ශ්‍රමිකයන් සිටී යැයි හඳුනාගත් ප්‍රදේශ හා ඊට හේතු

ශ්‍රී ලංකාව තුළ ඉතාමත් සුළු වශයෙන් ළමා ශ්‍රමිකයින් ව්‍යාප්ත වීමත්, ඔවුන් හඳුනා ගැනීම අපහසු වීමත් නිසා ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනයේ තොරතුරු ලබා ගන්නා එක් ක්‍රමවේදයක් ලෙස කඩිනම් තක්සේරු ක්‍රමය භාවිතා කරන ලදී. මෙහි දී ළමා ශ්‍රමිකයින් සිටී යැයි හඳුනාගත් ප්‍රදේශයන් හි ජනතාව සමග සාකච්ඡා කිරීම මගින් ළමා ශ්‍රමිකයන් හඳුනා ගැනීම මෙන් ම ඒ සඳහා බලපාන ලද කරුණු පිළිබඳ ව හඳුනා ගන්නා ලදී. මේ සඳහා කොළඹ හා කොළොන්නාව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි පිහිටි ග්‍රාම නිලධාරි වසම් තෝරා ගන්නා ලදී.

ඒ අනුව පහත සඳහන් විශේෂිත ප්‍රදේශ වලදී ළමා ශ්‍රමිකයන් වාර්තා විය.

**මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වූ ප්‍රදේශ**

- බොහෝ විට මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වූ ප්‍රදේශයන් දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාව වෙසෙන ප්‍රදේශ වේ. එසේ ම මෙම පවුල්වල දෙමව්පියන් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීම කුටුම්භයන් හි ආර්ථික තත්ත්වය තව දුරටත් පහළ වැටීම ට හේතු වේ. මේ නිසා ම මෙම ප්‍රදේශයන් හි දරුවන් අධ්‍යාපනය නො ලැබීමටත්, පවුලේ ආර්ථිකය සඳහා දායකවනු පිණිස කුමන හෝ රැකියාවක් කිරීමටත් යොමු වේ.

- එසේම මෙවැනි ප්‍රදේශයන් හි ළමා ශ්‍රමය ඉතා අඩු මිලට ලබා ගැනීමේ හැකියාව ඇති අතර මත්ද්‍රව්‍ය අලෙවිය සඳහා දරුවන් යොදා ගැනීම ආරක්ෂාකාරී උපායමාර්ගයක් ලෙස සලකයි. මේ නිසාම දරුවන් එවැනි කාර්යයන් සඳහා යොදා ගැනීම දක්නට ලැබේ.

- මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වූ පරිසරයක, දරුවන් වැඩි වශයෙන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු කරවන අතර ඊට අවශ්‍ය මූල්‍යමය ශක්තිය ලබා ගනු වස් දරුවන් රැකියා සඳහා යොමු වේ.

**වීදි දරුවන් වෙසෙන ප්‍රදේශ**

- මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වූ ප්‍රදේශයන් මෙන්ම වීදි දරුවන් වෙසෙන ප්‍රදේශයන් ද දරුවන් සඳහා අනාරක්ෂිත පරිසරයකි. ආර්ථික දුෂ්කරතා, අධ්‍යාපනය සඳහා යොමු වීමේ ගැටලු, ගෘහස්ථ අස්ථාවරතාවය, සංවිධානාත්මක සමාජ ආරක්ෂක පද්ධති අඩු කම වැනි හේතු දරුවන් නිතැතින් ම ආර්ථික කටයුතු ඉටු කිරීම දෙසට තල්ලු කරයි.

**නාගරික ජනාකීර්ණ ප්‍රදේශ**

- මෙම ප්‍රදේශයන් හි පවතින සංකීර්ණ සමාජයීය පාරිසරික වටපිටාව දරුවන් කෙරෙහි අහිතකර ලෙස බලපෑනු ලබයි. දරිද්‍රතාවය, අධ්‍යාපනය නො මැතිකම, අවිධිමත් ශ්‍රම වෙළෙඳපොළ, සංස්කෘතික හා සමාජයීය සාධක නාගරික ප්‍රදේශවල ළමුන් ශ්‍රමය ට දිරිමත් කරන හෝ බල කරන පරිසරයක් නිර්මාණය කරයි.

# 5 පරිච්ඡේදය


## නිගමන හා යෝජනා

### 5.1 ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ඉදිරිපත් වූ යෝජනා

ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ මහජන අදහස් ලබා ගැනීම මෙම අධ්‍යයනයේ එක් අරමුණකි. ප්‍රශ්නාවලියේ iv වන කොටස ඒ සඳහා වෙන් කරන ලදී. අධ්‍යයනය සඳහා තොරතුරු ලබා දුන් නිවාස ඒකක වලින් 74.4% ක් මෙම ප්‍රශ්නය සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී. එම යෝජනාවන් ප්‍රධාන යෝජනා 10 ක් යටතේ වර්ග කළ අතර 5.2 ප්‍රස්තාරය මගින් මෙම තොරතුරු ඉදිරිපත් කර ඇත.

ඒ අනුව යෝජනා ඉදිරිපත් කල පිරිස අතරින් වැඩිම පිරිසක් ඉදිරිපත් කරන ලද යෝජනාව වූයේ පාසල් නො යන දරුවන් අනිවාර්යයෙන් ම පාසල් වෙත යොමු කළ යුතු බව යි. එසේ ප්‍රකාශ කළ පිරිස 54.8% කි. ආර්ථික දුෂ්කරතා හේතුවෙන් පාසල් නො යන දරුවන් සඳහා සෘජුව ම රජය මැදිහත් විය යුතු බවත්, එසේ මැදිහත් වීමෙන් දරුවන් පාසල් වෙත යොමු කිරිම ට කටයුතු කළ යුතු බවත් ඔවුන්ගේ අදහස විය.

**ප්‍රස්තාර අංක 5.2: ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වූ යෝජනා**



20.6% ක ප්‍රතිශතයක් ප්‍රකාශ කර සිටියේ පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීම මගින් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා පිටුබලයක් ලැබෙනා බවයි. එනම් දරිද්‍රතාවය දරුවන් ආර්ථික කටයුතු සඳහා යොමු කරන හේතූන් අතර ප්‍රධානත ම හේතුවක් වන බැවින් ඒ සඳහා විසඳුම් ලබා දීම ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ද ඉවහල් වන බවයි.

යෝජනා ඉදිරිපත් කරන ලද පිරිසෙන් 17.4% ක ගේ අදහස වූයේ පවතින අධ්‍යාපන ක්‍රමය වෙනස් කිරීම මේ සඳහා විසඳුමක් වන බවයි. එනම් දැනට පවතින ශාස්ත්‍රීය අධ්‍යාපනය හා සමාන වැදගත්කමක් වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය කෙරෙහි ද ලබා දිය යුතු බවයි. ඒ මගින් ශාස්ත්‍රීය අධ්‍යාපනය සඳහා දුර්වල නිසා ම අතර මගදී පාසල හැර යාමට සිදුවන දරුවන් හට ඔවුන් තුළ ඇති ප්‍රායෝගික කුසලතා වලින් ප්‍රයෝජන ගැනීමට හැකි වීම, තාක්ෂණික පුහුණුව ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීම තුළින් පුහුණු ශ්‍රමය සඳහා ඇති ඉල්ලුම සපුරාලීමට හැකි වීම, වැනි හේතූන් මත ළමා ශ්‍රම ගැටලුවට සාර්ථක ව මුහුණ දීමට හැකි බව ඔවුන්ගේ අදහස විය.

මත්ද්‍රව්‍ය නිවාරණය කිරීම ට කටයුතු කිරීම ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ප්‍රබල දායකත්වයක් දක්වන බව 3.3% කගේ අදහස විය. මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය කුටුම්භයන් දරිද්‍රතාවය ට තල්ලු කිරීම, දරුවන් සඳහා අධ්‍යාපන අවස්ථා අහිමි කිරීම, දරුවන් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි කිරීම, වෙනත් සාමාජයීය, පාරිසරික ව්‍යවසනයන් සඳහා ගොදුරු කිරීම, වැනි සෘණාත්මක ප්‍රතිඵලයන් ඇති කිරීමට හේතු වන්නා වූ ප්‍රධාන ම සාධකයකි. එම සාධකය මුලිනුපුටා දැමීම ළමා ශ්‍රමය තුරන් කිරීමට මෙන් ම බොහෝ සමාජයීය ව්‍යවසනයන්ගෙන් සමාජය මුදා ගැනීමට ද හේතු වේ.

එසේ ම දෙමව්පියන් වැඩිහිටියන් මෙන් ම දරුවන් ද දැනුම්වත් කිරීම, ළමා ශ්‍රමය ට එරෙහි ව නීති මගින් අවශ්‍ය කටයුතු කිරීම, මෙම ගැටලුව සඳහා ඉදිරිපත් වූ යෝජනා අතර විය.

ඉදිරිපත් වූ අනිකුත් යෝජනා අතරින් ආකල්ප වර්ධනය, වීදි දරුවන් එයින් මුදවා ගැනීම සඳහා විශේෂිත වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ළමා ශ්‍රමය ව්‍යාප්ත ව ඇති ප්‍රදේශයන් හඳුනා ගැනීම හා එම ප්‍රදේශයන් සඳහා විශේෂිත වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදි යෝජනා දැක්විය හැකි ය.

## 5.2. නිගමන

1. ශ්‍රී ලංකාව ළමා ශ්‍රමිකයන් පිළිබඳ ගැටලුවට සාර්ථකව මුහුණ දෙමින් සිටිනා බව; එනම් 0.3% ක පමණ ළමා ශ්‍රමික ප්‍රතිශතයක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වුව ද එම පිරිස දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රදේශවල ට පමණක් සීමා වීම.

2. මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය ළමා ශ්‍රමය වැඩි වීම කෙරෙහි වැඩි ම දායකත්වයක් දක්වන බව

3. මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වූ ප්‍රදේශ, වීදි දරුවන් වෙසෙන ප්‍රදේශ හා නාගරික ජනාකීර්ණ ප්‍රදේශ වැනි ප්‍රදේශ වල වැඩි වශයෙන් ළමා ශ්‍රමිකයන් කේන්ද්‍ර ගත ව සිටින බව

4. ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී එම ප්‍රදේශවලට ප්‍රමුඛතාවය ලබා දීම, එම ප්‍රදේශයන්වලට ආවේණික උපායමාර්ග හඳුනා ගැනීම හා ඒ සඳහා දිගුකාලීන වැඩසටහන් වල අවශ්‍යතාවය

5. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් දරුවන් පාසල තුළින් ම රැකියා සඳහා යොමු කිරීම ට අවශ්‍ය දැනුම හා හැකියාව ලබා දීම.

6. 1.3% ක් වන අක්‍රිය දරුවන් ශාරීරික මෙන් ම මානසික සෞඛ්‍ය ගැටලුවලට නිරාවරණය වීම, සමාජ සංවර්ධන ගැටලු වලට නිරාවරණය වීම මෙන් ම හානිකර හැසිරීම් වල අවධානම ට මුහුණ දීම වැනි අවධානම්කාරී පරිසරයක ජීවත් වන බැවින් ඔවුන් අරමුණු කරගෙන විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා එම දරුවන්ගේ ශ්‍රමය ඵලදායී ව යොදා ගැනීමට කටයුතු කිරීම

7. ළමා ශ්‍රමය සඳහා තිරසාර විසඳුමක් ලබා දීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් අත්‍යවශ්‍ය බව; ඊට හේතු වන්නේ මෙම ප්‍රශ්නය ආර්ථික, සාමාජයීය, දේශපාලනික සහ සංස්කෘතික සාධකවල සංකීර්ණ අන්තර් ක්‍රියාකාරීත්වය හේතුවෙන් පැන නගින සහ එ මගින් ව්‍යාප්ත වන ගැටලුවක් බැවිනි. ළමා ශ්‍රමය තුරන් කිරීමේ ගැටලුවට ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීමේ දී, එක් එක් ගැටලුව සඳහා හුදකලා විසඳුම් සෙවීම ට වඩා බහුවිධ මානයන් හරහා මනා සම්බන්ධීකරණයක් සහිත යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය 2008/09
   https://www.dol.gov/sites/dolgov/files/ILAB/research_file_attachment/Child_Activity_Survey_2008-09_Final_Report_SriLanka.pdf

2. ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය 2016
   http://www.statistics.gov.lk/Resource/en/OtherCensusandSurveys/SurveyReports/Child_Activity%20_Survey_2016.pdf

3. ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
   https://www.ilo.org/sites/default/files/wcmsp5/groups/public/@ed_norm/@ipec/documents/publication/wcms_717439.pdf

4. Decent work indicators, ILO manual Second version
   https://www.ilo.org/sites/default/files/wcmsp5/groups/public/@dgreports/@integration/documents/publication/wcms_229374.pdf

5. Resolution concerning statistics of child labour
   file:///C:/Users/Acer/Downloads/wcms_112458.pdf

# ඇමුණුම

## ප්‍රශ්නාවලිය

**කම්කරු දෙපාර්තමේන්තුව**

දිස්ත්‍රික්කය ..........................................................................................
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ...............................................................
ග්‍රාම නිලධාරී කොට්ඨාශය අංකය ......................... නම .....................
අංශය (ග්‍රාමීය / නාගරික / වතු ) ...........................................................

ගෘහ මූලික අංකය ......................................................................................
ගෘහ මූලිකගේ නම ....................................................................................
ලිපිනය ........................................................................................
........................................................................................

### I කොටස - හඳුනාගැනීමේ තොරතුරු

| අනු අංකය | නම | ගෘහ මූලිකට ඇති නෑදෑකම | ස්ත්‍රී/ පුරුෂ භාවය | උපන් දිනය | | වයස | ජාතිය | ආගම | විවාහක තත්වය | අධ්‍යාපන මට්ටම | අවු. 18ට අඩු දරුවන් සඳහා පමණි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | අවුරුද්ද | මාසය | | | | | | පියා ජීවත් වන්නේ | මව ජීවත් වන්නේ |
| (01) | (02) | (03) | (04) | (05) | | (06) | (07) | (08) | (09) | (10) | (11) | |
| 01 | | | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | | |
| 03 | | | | | | | | | | | | |
| 04 | | | | | | | | | | | | |
| 05 | | | | | | | | | | | | |
| 06 | | | | | | | | | | | | |
| 07 | | | | | | | | | | | | |
| 08 | | | | | | | | | | | | |
| 09 | | | | | | | | | | | | |
| 10 | | | | | | | | | | | | |

(03) **ගෘහ මූලිකයාට ඇති නෑදෑකම**
ගෘහ මූලික ............ 1
සැමියා / බිරිඳ .......... 2
පුතා /දුව ............. 3
බෑනා/ලේලි .......... 4
මව/පියා ................ 5
වෙනත් නෑදෑයෙක් 6
වෙනත් .................. 9

(04) **ස්ත්‍රී පුරුෂ භාවය**
පුරුෂ ......... 1

(08) **ආගම**
බෞද්ධ ........... 1
හින්දු ............... 2
ඉස්ලාම් ........... 3
කතෝලික.. .... 4
වෙනත් ........... 9

(07) **ජාතිකත්වය**
සිංහල ............... 1
ශ්‍රී ලංකා දෙමළ .. 2
ඉංදියානු දෙමළ .... 3
යෝනක ........... 4
මැලේ ............... 5
බර්ගර් .............. 6
වෙනත් ............. 9

(09) **විවාහක තත්වය**
අවිවාහක ............... 1
විවාහක (ලියාපදිංචි) 2
විවාහක (චාරිත්‍රානුකූල) 3
වැන්දඹු ..................... 4
දික්කසාද .................. 5
වෙන්ව ජීවත් වන ... 6

(10) **අධ්‍යාපන මට්ටම**
1 වසරේ ඉගෙනුම ලබන..01
1 ශ්‍රේණිය සමත් ............ 02
2 ශ්‍රේණිය සමත් .... .. 03
3 ශ්‍රේණිය සමත් .......... .. 04
4 ශ්‍රේණිය සමත් ............ 05
5 ශ්‍රේණිය සමත් ............ 06
6 ශ්‍රේණිය සමත් ............. 07
7 ශ්‍රේණිය සමත් ............. 08
8 ශ්‍රේණිය සමත් ............. 09
9 ශ්‍රේණිය සමත් .................. 10
10 ශ්‍රේණිය සමත් ............... 11
අ.පො.ස. (සා/පෙ) සමත් .... 12
12 ශ්‍රේණිය සමත් ............... 13
අ.පො.ස. (උ/පෙ) සමත් ..... 14
උපාධිය සමත් .................... 15
විශේෂ අධ්‍යාපනය ලබන .... 16
පාසැල් නොයන ................ 17

(11) **පියා/මව ජීවත් වන්නේ**
මෙම ඒකකය තුළ ............................ 1
ඒකකයෙන් පිටත (මෙරට) .................... 2
ඒකකයෙන් පිටත (විදෙස්ගතව) ............... 3
මියගොස් ඇත .......... 4
නොදනී ...................... 5

## II කොටස - අධ්‍යාපන තොරතුරු (අවුරුදු 5-18 අතර දරුවන් සඳහා)

| නම | | 01 ........................ | 02 ........................ |
|---|---|---|---|
| 2.1 ඔහු/ඇය දැනට පාසැල් යනවාද? | ඔව් | 1 | 1 |
| | නැත | 2 — 2.5ට යන්න | 2 — 2.5ට යන්න |
| 2.2 ඔහු/ඇය දැනට අධ්‍යාපනය ලබන්නේ කුමන ශ්‍රේණියේද? | | ☐☐ | ☐☐ |
| 2.3 පසුගිය සතිය තුළ ඔහුට / ඇයට පාසල් දින කිසිවක් මග හැරී තිබේද? | ඔව් | 1 | 1 |
| | නැත | 2 — III කොටසට යන්න | 2 — III කොටසට යන්න |

2.4 පසුගිය සතිය තුළ ඔහු / ඇය පාසලට නොපැමිණි ප්‍රධාන හේතුව කුමක්ද?

| | 01 | 02 |
|---|---|---|
| 1. පාසල් නිවාඩු කාලය ........................................ | 1 | 1 |
| 2. ගුරුවරයා නොපැමිණීම .................................... | 2 | 2 |
| 3. අයහපත් කාලගුණික තත්ත්වය .......................... | 3 | 3 |
| 4. ආර්ථික දුෂ්කරතා ........................................... | 4 | 4 |
| 5. එදිනෙදා ගෘහ කටයුතු සඳහා උපකාර කිරීම .......... | 5 | 5 |
| 6. නිවසේදී ආබාධිතයෙකුට උපකාර කිරීම .............. | 6 | 6 |
| 7. කුඩා දරුවන් රැකබලා ගැනීම ........................... | 7 | 7 |
| 8. අසනීප / තුවාල .............................................. | 8 | 8 |
| 9. අමතර පන්ති සඳහා සහභාගි වීම ......................... | 9 | 9 |
| 10. නිවසින්පිට තාවකාලිකව රැඳී සිටීම. .................. | 10 | 10 |
| 11. ගුරුවරයා විසින් තරවටු කිරීම/දොස් පැවරීම ....... | 11 | 11 |
| 12. වෙනත් (සඳහන් කරන්න) . ............................ | 12 | 12 |
| | 1–12: III කොටසට යන්න | 1–12: III කොටසට යන්න |

| | | 01 | 02 |
|---|---|---|---|
| 2.5 ඔහු / ඇය කවදා හෝ පාසල් ගොස් තිබේද? | ඔව් | 1 — 2.7ට යන්න | 1 — 2.7ට යන්න |
| | නැත | 2 | 2 |

2.6 ඔහු/ඇය කිසිදා පාසල් නොගිය ප්‍රධාන හේතුව කුමක්ද?

| | 01 | 02 |
|---|---|---|
| 1. ආබාධිත ............................ .......................... | 1 | 1 |
| 2. සුදුසු පාසලක් බලා සිටීම ................................ | 2 | 2 |
| 3. නිදන්ගත රෝග ............................................. | 3 | 3 |
| 4. මූල්‍ය දුෂ්කරතා.......................... ................. | 4 | 4 |
| 5. අධ්‍යාපනය ගැන උනන්දු නොවීම ...................... | 5 | 5 |
| 6. උප්පැන්න සහතිකය නොතිබීම ........................ | 6 | 6 |
| 7. වෙනත් (සඳහන් කරන්න) ................................ | 7 | 7 |
| | 1–7: III කොටසට යන්න | 1–7: III කොටසට යන්න |

| | 01 | 02 |
|---|---|---|
| 2.7 ඔහු/ඇය පාසල හැර ගියේ හෝ තාවකාලිකව පාසල නතර කළේ කුමන වයසේදීද? | ........................... | ........................... |

2.8 පාසල හැර යාමට ප්‍රධාන හේතුව කුමක්ද?

| | 01 | 02 |
|---|---|---|
| 1. පාසල දුර වැඩි වීම. ........................................ | 1 | 1 |
| 2. ආබාධිත...................................................... | 2 | 2 |
| 3. නිදන්ගත රෝග ............................................ | 3 | 3 |
| 4. මූල්‍ය දුෂ්කරතා ............................................. | 4 | 4 |
| 5. අධ්‍යාපනයේ දුර්වල / පාසල් යාමට උනන්දුවක් නැති ..... | 5 | 5 |
| 6. රැකියා පුහුණුවක් / වෘත්තීය පුහුණුවක් ලබා ගැනීමට | 6 | 6 |
| 7. ආර්ථික ක්‍රියාකාරකම්වල නියැලීම/උදව් කිරීම .... | 7 | 7 |
| 8. එදිනෙදා ගෘහ කටයුතු සඳහා උපකාර කිරීම ...... | 8 | 8 |
| 9. නිවසේදී G.C.E (සා.පෙළ) ඉගෙනීම............... | 9 | 9 |
| 10. ගුරුවරයා විසින් තරවටු කිරීම/දෝෂ දර්ශනයට ලක් කිරීම | 10 | 10 |
| 11. පාසලෙන් ඉවත්වීමේ දි අස්වීම් සහතිකය ලබා නොදීම | 11 | 11 |
| 12. වෙනත් (සඳහන් කරන්න) ........................................ | 12 | 12 |

**III කොටස - ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු (අවුරුදු 5-18 අතර දරුවන් සඳහා)**

| | | | |
|---|---|---|---|
| 3.1 ඔහු / ඇය පසුගිය සතිය තුළ අවම වශයෙන් පැයක්වත් කිසියම් කාර්යයක නිරත වූවාද? (සේවකයෙකු/ තමන්ගේම ආර්ථික කටයුතු කරන්නෙකු/ සේවායෝජකයකු/ වැටුප් නොලබන පවුලේ සේවකයා) | ඔව් | 1 3.3ට යන්න | 1 3.3ට යන්න |
| | නැත | 2 | 2 |
| 3.2 ඔහු/ඇය පසුගිය සතියේ වැඩ නොකළත්, ඔහුට/ඇයට කිරීමට යම් රැකියාවක්, ව්‍යාපාරයක් හෝ ව්‍යවසායයක් තිබුණේද? | ඔව් | 1 | 1 |
| | නැත | 2 3.17ට යන්න | 2 3.17ට යන්න |
| 3.3 ප්‍රධාන රැකියාව /ආර්ථිකය ක්‍රියාකාරකම සඳහන් කරන්න | | .........................<br>.........................<br>......................... | .........................<br>.........................<br>......................... |
| 3.4 එම රැකියාව අයත් ප්‍රධාන කර්මාන්තය සඳහන් කරන්න | | .........................<br>......................... | .........................<br>......................... |

3.5 ඔහුගේ / ඇයගේ ප්‍රධාන කාර්යය ඉටු කළේ කොහේදී ද?

| | | |
|---|---|---|
| 1. පදිංචි වාසස්ථානයේ සිට ........................................................ | 1 | 1 |
| 2. සේවායෝජකයාගේ නිවසෙහි සිට ........................................... | 2 | 2 |
| 3. විධිමත් කාර්යාලයක ........................................................... | 3 | 3 |
| 4. කර්මාන්ත ශාලාවක ............................................................. | 4 | 4 |
| 5. ගොවිපලක / වත්තක....................... ..................................... | 5 | 5 |
| 6. ඉදිකිරීම් ස්ථානයක ................................................... ......... | 6 | 6 |
| 7. සාප්පු / වෙළඳපොලවල් ......................................................... | 7 | 7 |
| 8. විවිධ ස්ථාන (ජංගම) ........................................................... . | 8 | 8 |
| 9. වීදියේ (ස්ථාවර ස්ථානය) ...................................................... | 9 | 9 |
| 10. ආපනශාලා / හෝටල් ................................................... ..... | 10 | 10 |
| 11. වැවිලි අංශය ....................... .............................................. | 11 | 11 |
| 12. මාළු ආශ්‍රිත ස්ථාන / ඝාතකාගාර ............................................. | 12 | 12 |
| 13. වෙනත් (සඳහන් කරන්න) ....................................................... | 13 | 13 |

3.6 ඔහුගේ/ඇයගේ රැකියා තත්ත්වය කුමක්ද?

| | | |
|---|---|---|
| 1. සේවකයා ..................... .............................................................. | 1 | 1 |
| 2. තමන්ගේම ආර්ථික කටයුත්තක් කරන්නා ................................. .. | 2 | 2 |
| 3. සේවායෝජකයා ....... ........................................................... | 3 | 3 |
| 4. වැටුප් නොලබන පවුලේ සේවකයා ............................................ | 4 | 4 |

3.7 වැටුප් හැර ඔහුට / ඇයට රැකියාව තුලින් ලැබුණු අනිකුත් ප්‍රතිලාභ මොනවාද

| | | |
|---|---|---|
| 1. සතිපතා විවේක නිවාඩු ........................................................... | 1 | 1 |
| 2. වැටුප් සහිත නිවාඩු ....................................................... ........... | 2 | 2 |
| 3. වෛද්‍ය වියදම් ............................................................... ...... | 3 | 3 |
| 4. අධ්‍යාපනයට ආධාර .................................................................. | 4 | 4 |
| 5. නොමිලේ නවාතැන් .............................................................. | 5 | 5 |
| 6. ආහාර ....................... ....................................................... | 6 | 6 |
| 7. රෙදි ලබා ගැනීම ................ ................................................ | 7 | 7 |
| 8. ප්‍රවාහනය ............................... .......................................... | 8 | 8 |
| 9. වෙනත් (සඳහන් කරන්න) ........................................................ | 9 | 9 |

| | | |
|---|---|---|
| 3.8 ප්‍රධාන රැකියාවෙන් ඔහුට / ඇයට ලැබෙන සාමාන්‍ය මාසික ආදායම කොපමණද? | ......................... | ......................... |
| 3.9 පසුගිය සතියේ වැඩ කරන ලද පැය ගණන | ☐☐ | ☐☐ |

3.10 පසුගිය සතිය තුළ ඔහු/ඇය වැඩිපුරම මෙම කටයුතු සිදු කළේ කුමන වෙලාවේ ද

| | | |
|---|---|---|
| 1. දිවා කාලයේ (පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා) ......................... | 1 | 1 |
| 2. සවස් කාලයේ (ප.ව. 6.00 සිට රාත්‍රී 8.00 දක්වා). ......................... | 2 | 2 |
| 3. රාත්‍රී 8:00 සිට උදෑසන 6:00 දක්වා ........... ................................ | 3 | 3 |
| 4. දවස පුරා..................................... .......................................... | 4 | 4 |
| 5. සති අන්ත පමණක්........................... .................................... | 5 | 5 |
| 6. උදෑසන පාසල් යාමට පෙර ............................................... | 6 | 6 |
| 7. පාසල් අධ්‍යාපනයෙන් පසු සවස 6.00 දක්වා ................................ | 7 | 7 |
| 8. වෙනත් (නිශ්චිත) ................................................................... | 8 | 8 |

| | | |
|---|---|---|
| **3.11** ගෙවීමේ ආකාරය කුමක්ද? (වැටුප් නොලබන පවුලේ සේවකයන්ට අදාළ නොවේ) | | |
| 1. කෑලි අනුපාතය ...... ............................................................ | 1 | 1 |
| 2. දෛනික වැටුප් .......... ............................................................ | 2 | 2 |
| 3. සතිපතා .......... ............................................................ | 3 | 3 |
| 4. මාසිකව ...................... ............................................................ | 4 | 4 |
| 5. වෙනත් ............................................................................ | 5 | 5 |
| **3.12** ඔහු/ඇය ඔහුගේ/ඇයගේ ඉපැයීම්වලින් කළේ කුමක්ද? (වැටුප් නොලබන පවුලේ සේවකයන්ට අදාළ නොවේ) | | |
| 1. දෙමාපියන්ට හෝ භාරකරුවන්ට ලබා දීම.................................. | 1 | 1 |
| 2. ඔහු / ඇය විසින්ම වියදම් කිරීම ................................................... | 2 | 2 |
| 3. එයින් කොටසක් දෙමාපියන්ට දීම ............................................... | 3 | 3 |
| 4. තවමත් මුදල් උපයා නැත ........................................................ | 4 | 4 |
| 5. වෙනත් (නිශ්චිත) ...................................................................... | 5 | 5 |
| **3.13** ඊට අමතරව ඔහු/ඇය වෙනත් ආර්ථික කටයුතු කළාද? | ඔව් | ඔව් |
| | නැත | නැත |
| **3.14** ඔහු / ඇය පසුගිය සතියේ රැකියාවක් සොයමින් සිටියාද? | ඔව් | ඔව් |
| | නැත | නැත |
| **3.15** පසුගිය සති 4 තුළ ඔහු / ඇය රැකියාවක් සෙවීම සඳහා ගෙන ඇති ප්‍රධාන පියවර කුමක්ද? | | |
| 1. රැකියා නියෝජිතායතනවල ලියාපදිංචි වීම .............................. | 1 | 1 |
| 2. යහළුවන්/නෑදෑයන් ගෙන් උපකාර ලබා ගැනීම ......................... | 2 | 2 |
| 3. ඔහුගේ/ඇයගේ ව්‍යාපාරයක් පිහිටුවීම සඳහා උපකරණ, ණය, සේවා ස්ථානයක් ලබා ගැනීමට උත්සාහ කිරීම ........................................ | 3 | 3 |
| 4. වෙනත්( විස්තර කරන්න) ......................................................... | 4 | 4 |
| **3.16** ඔහු / ඇය කොපමණ කාලයක් රැකියාවක් සොයමින් සිටිනවාද? | | |
| **1.** මාස 6ට අඩු ................................................................................ | 1 | 1 |
| **2.** මාස 6-12 දක්වා .......................................................................... | 2 | 2 |
| **3.** මාස 12ට වැඩිය ......................................................................... | 3 | 3 |
| **3.17** පසුගිය මාස 12 තුළ ඔහු / ඇය කිසියම් කාර්යයක නිරත වී තිබේද? | ඔව් | ඔව් |
| | නැත අවසන් කරන්න | නැත අවසන් කරන්න |
| **3.18** එම කාර්යයේ කොපමණ කාලයක් නිරතව සිටියේ ද? | මාස [ ][ ] | මාස [ ][ ] |
| | දින [ ][ ] | දින [ ][ ] |
| **3.18** ඔහු විසින් සිදු කල කාර්යයන් අතර ප්‍රධාන ක්‍රියාකාරකම / රැකියාව කුමක්ද | ........................ ........................ | ........................ ........................ |
| **3.19** එම රැකියාව අයත් ප්‍රධාන කර්මාන්තය සඳහන් කරන්න | ........................ ...................... | ........................ ........................ |

**IV කොටස -**

**4.1** කම්කරු දෙපාර්තමේන්තුව විසින් දරුවන් සේවයේ යෙදවීම පිළිබඳ ගෙන ඇති විධිවිධාන පිළිබඳ දැනුවත් සිටින්නේ ද

ඔව් [ ] නැත [ ]

**4.2** දරුවන් සේවයේ යෙදවීම නතර කිරීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා මොනවාද?

..............................................................................................................................

..............................................................................................................................

සංඛ්‍යාලේඛන අංශය
10 වන මහල
කම්කරු දෙපාර්තමේන්තුව
මෙහෙවර පියස
නාරාහේන්පිට
කොළඹ 05.

stat@labourdept.gov.lk
011 2368055
011 2104876